# තාක්ෂණික ආයතනය

# මොරටුව විශ්වවිද්‍යාලය



# ශ්‍රී ලංකාව

## වාර්ෂික වාර්තාව සහ වාර්ෂික ගිණුම්

## 2020

ආයතනයේ පාලක මණ්ඩලය විසින් **26.03.2021** දින පවත්වන ලද එහි **232** වන රැස්වීමේදී මෙම වාර්තාව අනුමත කරන ලදී

## දැක්ම

තාක්ෂණ අධ්‍යාපනය පිළිබඳ විශිෂ්ය මධ්‍යස්ථානයක් බවට පත් කිරීම.

## මෙහෙවර

කලාපයේ ක්‍රියාශීලී තාක්ෂණ ආයතනයක් බවට පත්කිරීම මෙන්ම ලාංකීය ප්‍රජාවගේ අධ්‍යාපනය, ආර්ථික සහ සමාජීය දියුණුව සඳහා සක්‍රීය දායකත්වය ලබා දීම.

- සමාජයේ සහ කර්මාන්තකරණයේ අවශ්‍යතා සපුරාලීම සඳහා ළඟා විය හැකි නම්‍යතාවයෙන් යුතු කාර්යක්ෂම අධ්‍යාපනයක් සහ පුහුණුව ලබාදීම.
- නව්‍යකරණ සහ නිර්මාණශීලී පරිසරයක් ගොඩනැගීම.
- වෘත්තීය අවශ්‍යතා සඳහා කර්මාන්ත ක්ෂේත්‍රය සහ ව්‍යාපාරික ප්‍රජාව සමඟ ක්‍රියාශීලී සංවාදයක් ඇති කිරීම.
- තරුණයින්ට සමාජීය ආර්ථික මාර්ගයන් සඳහා විවෘත වන අවස්ථාවන් පුළුල් කිරීම.

# 01. නිසිබලධාරීතුමාගේ සමාලෝචනය

## සමාලෝචනය 2020 වර්ෂය



මොරටුව විශ්වවිද්‍යාලීය තාක්ෂණික ආයතනය (ITUM) මූලික වශයෙන් රසායන, සිවිල්, විදුලි, විද්‍යුත්, තොරතුරු තාක්ෂණය, යාන්ත්‍රික, සමුද්‍රික, නාවික, බහුඅවයවික, රෙදිපිළි යන අංශ වල ජාතික තාක්ෂණ ඩිප්ලෝමා පාඨමාලාව (NDT) මෙහෙයවීම සම්බන්ධයෙන් පිළිගැනීමට ලක් වූ තාක්ෂණ අධ්‍යාපනය පිළිබඳ ශ්‍රී ලංකාවේ ප්‍රමුඛ පෙළේ උසස් අධ්‍යාපනික ආයතනයකි.

නිසිබලධාරී තනතුර වර්ෂය තුළදී තෙවරක් වෙනස් වීම සහ කොවිඩ් 19 වසංගත තත්වය හේතුවෙන් 2020 වර්ෂය ආයතනයට අභියෝගාත්මක වර්ෂයක් වීය. තවද ආයතනය සිසුන් 1600 කට එකවර අධ්‍යයන කටයුතු පවත්වාගෙන යන ලද ප්‍රථම අවස්ථාවද මෙය විය.

ආයතනයේ නිසිබලධාරී වශයෙන් ආචාර්ය සුනිල් ජයන්ත නවරත්න මහතා 2020 ජනවාරි 1 දින පත් කරන ලද අතර ඉන් පසුව එම තනතුර සඳහා මහාචාර්ය එස්.එම්. ඒ. නානායක්කාර මහතා 2020 ජූලි 2 දින සිට පත් කරන ලදී. පසුව ආචාර්ය සී. සුජීව ලෙවන්ගමගේ මහතා 2020 ඔක්තෝබර් 1 දින සිට ආයතනයේ නිසිබලධාරී වශයෙන් පත් කරන ලදී.

වර්ෂය ආරම්භයේදී ආයතනය දෙවන හා සිව්වන අර්ධවර්ෂය සඳහා අධ්‍යයන කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යන ලද අතර එම සිසුන් සඳහා අර්ධවර්ෂ අවසන් විභාග පිළිවෙලින් පෙබරවාරි සහ ජනවාරි මාස වල පවත්වන ලදී. බහුඅවයවික තාක්ෂණ අධ්‍යනාංශය විසින් පොලිමර්ටෙක් 20 සභරාව මාර්තු 13 දින එළිදක්වන ලදී. කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් මාර්තු මස අවසානයේ ආයතනය තාවකාලිකව වසා දමන ලදී. කොවිඩ් 19 ආශ්‍රිත නිරෝධායන මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීම සඳහා ආයතනයේ නේවාසිකාගාර පරිශ්‍රය ශ්‍රී ලංකා යුද හමුදාව සහ සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත මුදා හරින ලදී. එබැවින් නේවාසිකාගාර පරිශ්‍රය ආයතනයේ සිසුන් සහ කාර්යමණ්ඩලය සඳහා වසා දමන ලදී. එතැන් සිට අධ්‍යයන කටයුතු මාර්ගගත ක්‍රමය යටතේ සිදු කරන ලදී. සෞඛ්‍ය නීතිරීති සාර්ථකව අනුගමනය කිරීමෙන් අනතුරුව 2020 ජූලි 10 දින ආයතනය කාර්යමණ්ඩලය සඳහා භෞතිකව විවෘත කරන ලදී.

රජය විසින් පනවන ලද කොවිඩ් 19 නීතිරීති අනුගමනය කරමින් සැප්තැම්බර් මාසයේදී ආයතනය තුන්වන අර්ධවර්ෂයේ සිසුන් සඳහා නැවත විවෘත කරන ලදී. නවක සිසුන් සඳහා නම්නීකරණ වැඩසටහන කොවිඩ් 19 නීතිරීති වලට අනුගත වෙමින් ඔක්තෝබර් 5 දින සාර්ථකව පවත්වන ලදී.

ඔක්තෝබර් 4 දින සිට කොවිඩ් 19 දෙවන රැල්ලේ ව්‍යාප්තියත් සමඟ රට නැවත අභියෝගාත්මක තත්වයකට පත් වූවද එම සියලු අභියෝග හමුවේ නොසැලී පහත සඳහන් කාර්යභාරයන් 2020 වර්ෂය තුලදී ක්‍රියාත්මක කරන ලදී.

- කොවිඩ් 19 වසංගත තත්ත්වය සමඟ අධ්‍යයන කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යාම.
- විධිමත් පාලනයක් පවත්වා ගන්නා අතරම සිසුන් තුළ යහපත් ආකල්ප ගොඩනැංවීමට ක්‍රියාකිරීම.
- මොරටුව විශ්වවිද්‍යාලීය තාක්ෂණික ආයතනයේ පර්යේෂණ, සංවර්ධන සහ තත්ත්ව සහතික
- යටිතල පහසුකම් සංවර්ධනය
- මූල්‍ය ස්ථාවරත්වය සහ ආදායම් උත්පාදනය
- ජාතික තාක්ෂණ ඩිප්ලෝමා පාඨමාලාව ප්‍රතිව්‍යුහගත කිරීම සහ ඩිප්ලෝමාධාරීන් සඳහා රැකියා අවස්ථා සංවර්ධනය කිරීම.
- 2021 ජනවාරි සිට ඉදිරියට ආයතනයට සිසුන් කණ්ඩායම් වශයෙන් කැඳවීම සඳහා අවශ්‍ය වන සෞඛ්‍ය සහ ආරක්ෂක මාර්ගෝපදේශ මොරටුව විශ්වවිද්‍යාලීය තාක්ෂණික ආයතනයේ හදිසි අවස්ථා කළමනාකරණ ඒකකය විසින් සම්පාදනය කරන ලදී. මෙම කාර්යය සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශයේ සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමැතිය 2020 දෙසැම්බර් මස අවසානයේදී ලැබී තිබේ.

ආචාර්ය සී. එස්. ලෙවන්ගමගේ
නිසිබලධාරී

| | පටුන | පිටු අංකය |
|---|---|---|
| | දැක්ම | 1 |
| | මෙහෙවර | 1 |
| 1. | නිසිබලධාරීගේ සමාලෝචනය | 2 |
| 2. | මොරටුව විශ්වවිද්‍යාලීය තාක්ෂණ ආයතනයේ අරමුණ | 10 |
| 3. | ජාතික තාක්ෂණ ඩිප්ලෝමා පාඨමාලාවේ ඉතිහාසය පිළිබඳ කෙටි හැඳින්වීමක් සහ මොරටුව විශ්වවිද්‍යාලයේ තාක්ෂණ ආයතනය ස්ථාපිත කිරීම | 11 |
| 4. | සංවිධාන සටහන - 2020 | 15 |
| 5. | කළමනාකරණ මණ්ඩලයේ සාමාජිකයින් | 16 |
| 6. | සබඳතා තොරතුරු | 17 |
| 7. | කාර්ය මණ්ඩල හා සිසුන් පිළිබඳ විස්තර | 18 |
| | 7.1 දේශීය සිසුන් පිළිබඳ විස්තර | 19 |
| | 7.2 අධ්‍යාපනික හා අධ්‍යාපනික නොවන කාර්යමණ්ඩලය පිළිබඳ විස්තර | 20 |
| 8. | පර්යේෂණ , නවෝත්පාදන සහ ප්‍රකාශන පිළිබඳ විස්තර | 21 |
| 9. | වැඩසටහන් සම්මන්ත්‍රණ සහ වැඩමුලු පිළිබඳ විස්තර | 25 |
| 10. | ශිෂ්‍ය ක්‍රියාකාරකම් | 28 |
| 11. | 2020 වර්ෂයේදී | 30 |
| 12. | යටිතල පහසුකම් සංවර්ධනය 2020 | 33 |
| 13. | පුනරාවර්තන වියදම් පිළිබඳ තොරතුරු | 34 |
| 14. | ප්‍රාග්ධන වියදම් පිළිබඳ විස්තර | 34 |
| 15. | මූල්‍ය ප්‍රගතිය පිළිබඳ තොරතුරු(වියදම්) | 34 |
| 16. | මූල්‍ය ප්‍රගතිය පිළිබඳ විස්තර ( උත්පාදිත ආදායම) | 35 |
| 17. | මූල්‍ය කාර්යසාධන විශ්ලේෂණය - 2020 | 35 |
| 18. | තිරසර සංවර්ධන අරමුණු | 36 |
| 19. | විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන | 44 |
| 20. | විගණකාධිපතිවරයාගේ වාර්තාව | 48 |
| 21. | විගණකාධිපතිවරයාගේ වාර්තාවට පිලිතුරු | 54 |

## ප්‍රතිස්ථාපනයෙන් පසු 2020 දෙසැම්බර් දක්වා මොරටුව විශ්වවිද්‍යාලයේ තාක්ෂණ ආයතනයේ ප්‍රගතිය

මොරටුව විශ්වවිද්‍යාලීය තාක්ෂණ ආයතනය ප්‍රතිස්ථාපනය හා සංවර්ධන ව්‍යාපෘතිය යටතේ, රු. බිලියන 10.2 ක වියදමින් තාක්ෂණ ආයතනය (ITUM) 2017 මැයි මසදී හෝමාගම දියගම ප්‍රදේශයේ සුන්දර වටපිටාවකින් හෙබි භූමියක සියලු පහසුකම් වලින් සමන්විතව ප්‍රතිස්ථාපනය කරන ලද අතර පාඨමාලා පරාසය පුළුල් කිරීම මෙන්ම බඳවා ගන්නා සිසුන් ප්‍රමාණය ඉහළ නැංවීම මෙහි අරමුණ විය. ආයතනය විසින් 2020 දෙසැම්බර් මස දක්වා අත්කරගත් ප්‍රගතිය පහත විස්තර කෙරේ.

### 1. සිසුන් බඳවා ගැනීම

තාක්ෂණ ආයතනයට (ITUM) බඳවා ගන්නා සිසුන් ප්‍රමාණය එහි ආරම්භය වන 2000 වර්ෂයේ සිටම වසර 17 ක් පුරා සිසුන් 350 සංඛ්‍යාවකට සීමා විය. කෙසේ වුවද ප්‍රතිසංවිධානයෙන් පසු 2018 වර්ෂයේ සිසුන් 480 ක් දක්වා වර්ධනය වූ අතර 2020 වර්ෂය වනවිට ආයතනයේ ලියාපදිංචි සිසුන් සංඛ්‍යාවක 800 ක් වශයෙන් සියයට සියයක් ඉක්ම වූ සීඝ්‍ර වර්ධනයකි.

| විෂය ධාරාව | 2018 | 2019 | 2020 |
|---|---|---|---|
| රසායනික | 31 | 50 | 50 |
| සිවිල් | 121 | 200 | 200 |
| විදුලි | 60 | 100 | 100 |
| විද්‍යුත් සහ විදුලි සංදේශ | 60 | 100 | 100 |
| යාන්ත්‍රික | 80 | 100 | 100 |
| සමුද්‍ර | 20 | 20 | 20 |
| නාවික | 20 | 20 | 20 |
| බහුඅවයවික | 30 | 46 | 50 |
| රෙදිපිලි | 60 | 64 | 60 |
| තොරතුරු තාක්ෂණ | - | 100 | 100 |
| එකතුව | 482 | 800 | 800 |

## 2. අර්ධවර්ෂ ක්‍රමය

මොරටුව විශ්වවිද්‍යාලීය තාක්ෂණික ආයතනය හෝමාගම දියගම ප්‍රතිස්ථාපනය කිරීමට පෙර, තාක්ෂණ ආයතනය විසින් ජාතික තාක්ෂණ ඩිප්ලෝමාව වාර්ෂිකව ප්‍රදානය කරන ලදී. කෙසේ වුවද, තාක්ෂණ ආයතනයේ අධ්‍යයන කාර්ය මණ්ඩලය විසින් සිදුකරන ලද පුළුල් අධ්‍යයනයකින් අනතුරුව **2018** වර්ෂය ආරම්භයේ සිට ජාතික තාක්ෂණ ඩිප්ලෝමා වැඩසටහන අර්ධවාර්ෂිකව පැවැත්වීමට තීරණය කරන ලදී. ඒ අනුව වර්ෂ තුනක ජාතික තාක්ෂණ ඩිප්ලෝමා වැඩසටහන අර්ධවර්ෂ **6** ක වැඩසටහනක් එනම් අර්ධවර්ෂ **4** ක අධ්‍යයන වැඩසටහනක් හා අර්ධවර්ෂ **2** ක පුහුණු වැඩසටහනක් ලෙසට පරිවර්තනය විය.

## 3. ජාතික තාක්ෂණ ඩිප්ලෝමා වැඩසටහන සඳහා සාමාර්ථ

සෑම අධ්‍යයන අර්ධවර්ෂයක්ම සාමාර්ථ 25 කින් යුක්ත වන අතර සෑම පුහුණු අර්ධවර්ෂයක්ම සාමාර්ථ 06 කින් යුක්ත වේ. ඒ අනුව ජාතික තාක්ෂණ ඩිප්ලෝමා වැඩසටහන සඳහා සම්පූර්ණ සාමාර්ථ සංඛ්‍යාව 112 කි.

## 4. මූල්‍ය හා පරිපාලන

**2017** වර්ෂයේදී අනුමත කරන ලද කාර්ය මණ්ඩල තනතුරු අභ්‍යන්තර මාරුකිරීම, උසස් කිරීම් සහ බාහිර අයදුම්පත් කැඳවීම තුළින් බඳවා ගැනීම සම්පූර්ණ කිරීමට ආයතනයට හැකිවිය.

ආයතනයේ අධ්‍යයන අංශ නම්:

බහුඅවයවික සහ රසායනික ඉංජිනේරු තාක්ෂණය

යාන්ත්‍රික ඉංජිනේරු තාක්ෂණය

සමුද්‍ර ඉංජිනේරු තාක්ෂණය

රෙදිපිළි සහ ඇඟලුම් තාක්ෂණය

සිවිල් ඉංජිනේරු තාක්ෂණය

අන්තර් විනය අධ්‍යයන

විදුලි , විද්‍යුත් සහ සන්නිවේදන තාක්ෂණය

තොරතුරු තාක්ෂණය

සම්බන්ධීකරණ නිලධාරියෙකුගේ මූලිකත්වයෙන් අන්තර් විනය අධ්‍යයන අංශය යටතේ ඉංග්‍රීසි භාෂා ඉගැන්වීම් ඒකකයක් (ELTU) ස්ථාපිත කිරීම සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමැතිය ලැබී ඇත. බොහෝ දුෂ්කරතා මගහරවාගෙන කළමනාකරණ මණ්ඩලය වෙත මොරටුව විශ්වවිද්‍යාලීය තාක්ෂණ ආයතනයේ ජයග්‍රහණ වාර්තා කිරීමට **2020** වර්ෂය තුළදී නිසිබලධාරී සමත් විය.

5. <u>අධ්‍යයන, පරිපාලන සහ අනධ්‍යයන කාර්යමණ්ඩලය</u>

- ආචාර්ය සුනිල් ජයන්ත නවරත්න මහතා ආයතනයේ නිසිබලධාරී වශයෙන් 2020 ජනවාරි 1 දින පත් කරන ලදී.
- මහාචාර්ය එස්.එම්. ඒ නානායක්කාර මහතා ආයතනයේ නිසිබලධාරී වශයෙන් 2020 ජූලි 2 දින සිට පත් කරන ලදී.
- ආචාර්ය සී. සුජීව ලෙවන්ගමගේ මහතා ආයතනයේ නිසිබලධාරී වශයෙන් 2020 ඔක්තෝබර් 2 දින සිට පත් කරන ලදී.

| සේවක සංඛ්‍යාව | අනුමත සේවක සංඛ්‍යාව | පවත්නා සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සේවක සංඛ්‍යාව |
|---|---|---|---|
| ප්‍රාථමික | 83 | 65 | 18 |
| ද්විතීයික | 81 | 53 | 28 |
| තෘතියික | 56 | 41 | 15 |
| ජෞෂ්ඨ | 85 | 59 | 26 |
| එකතුව | 305 | 218 | 87 |

6. <u>තත්ත්ව සහතික ඒකකය</u>

පිළිගත් ප්‍රමිතීන් හා එකඟ වූ අභ්‍යන්තර තත්ත්ව සහතික පද්ධතියක අවශ්‍යතාවය ආයතනයට දිගු කාලයක සිට පැවතුනි. මෙම අරමුණ සපුරා ගනු වස්, තත්ත්වය සහතික කිරීම, අඛණ්ඩ සංවර්ධනය සහ කාර්යක්ෂම කාර්යසාධනය යන කරුණු සහතික කිරීමේ

අරමුණින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ මාර්ගෝපදේශ අනුව සම්බන්ධීකරණ නිලධාරියෙකුගේ මූලිකත්වයෙන් තත්ව සහතික ඒකකයක් පිහිටුවන ලදී. ඒ අනුව සියලු වැඩසටහන් ඉගැන්වීම් ක්‍රියාපටිපාටි තත්ත්ව ආකෘතීන්ට අනුව හැඩගස්වා භාවිතයට ගනු ලැබේ.

7. <u>සිසුන්ට ආයතනය තුළ නේවාසික සහ අනෙකුත් පහසුකම් සැපයීම.</u>

සියලු සිසුන් සඳහා නේවාසික පහසුකම් සැපයීම ආයතනයේ ප්‍රතිපත්තිය වේ. එමනිසා දෙවන වසර සිසුන් 480 ක් හා පළමු වසර සිසුන් 800 ක් සඳහා නේවාසික පහසුකම් සපයන ලදී. සිසුන් සියලුම දෙනා පාහේ පරිශ්‍රය තුළ නේවාසිකව සිටී. සිසුන්ගේ කායික හා මානසික යහපැවැත්ම වර්ධනය කිරීමේ අරමුණින් අත්දැකීම් සහිත ශාරීරික අධ්‍යාපන උපදේශකවරු දෙදෙනෙකුගේ මග පෙන්වීම යටතේ අංග සම්පූර්ණ ව්‍යායාම් ශාලාවක් සහ ගෘහස්ත හා එළිමහන් ක්‍රීඩා පහසුකම් හා බිම් මට්ටමේ සේවක මණ්ඩලයක සහය ඇතිව සිසුන් සඳහා ක්‍රීඩා පහසුකම් සලසා දී ඇත. සියලුම සිසුන් වෙනුවෙන් නාමික මිලකට ආහාර සැපයීම සඳහා ආයතනයේ සහනාධාර ලබන ආපනශාලා දෙකක් ක්‍රියාත්මක වේ. කාර්යාල වේලාව තුළ සුදුසුකම්ලත් වෛද්‍ය කාර්යමණ්ඩලයක් යටතේ වෛද්‍ය මධ්‍යස්ථානයක් ක්‍රියාත්මක වන අතර රාත්‍රී කාලයේ දී සේවා අවශ්‍යතාවය මත ප්‍රවාහන සේවාවක් ක්‍රියාත්මක වේ.

8. <u>තාක්ෂණික ආයතන (ITUM) කාර්යය මණ්ඩලයට සුභසාධන පහසුකම් සැපයීම</u>

කාර්යය මණ්ඩලය සඳහා අවශ්‍යතාවය මත නිල නිවාස ලබා දී ඇත. ඊට අමතරව, බොහෝ අධ්‍යයන හා අනධ්‍යයන කාර්යමණ්ඩල සාමාජිකයන් සඳහා නේවාසිකාගාරවල ඉතිරි වී ඇති කාමරවල නවාතැන් පහසුකම් සලසා දී ඇත. කාර්යයමණ්ඩල ආපන ශාලාවක් හා දිවා සුරැකුම් මධ්‍යස්ථානයක් සේවක සුභසාධක සංගමයේ අධීක්ෂණය යටතේ ලබා දීමට ආයතනයට හැකි වී ඇත. හෝමාගම ලංකා බැංකුවේ ශාඛාවක් තාක්ෂණික ආයතන වෙළඳ සංකීර්ණයේ ස්ථාපිත කර සිසුන්ට හා කාර්යය මණ්ඩලයට බැංකු පහසුකම් සලසා දී ඇත.
කාගිල්ස් ෆුඩ් සිටි ශාඛාවක් එම වෙළඳ සංකීර්ණයේ ස්ථාපිත කර නේවාසික කාර්ය මණ්ඩලයේ හා සිසුන් ගේ අවශ්‍යතා සපුරා ගැනීමට පහසුකම් සලසා දී ඇත.

9. <u>අනෙකුත් උසස් අධ්‍යාපන ආයතන සඳහා අධ්‍යන සේවා ප්‍රතිපාදන - **2020**</u>

| ආයතනය | අධ්‍යන සේවා | වටිනාකම රු. |
|---|---|---|

| | | |
|---|---|---|
| ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයය | තාක්ෂණ පීඨයේ උපාධි අපේක්ෂකයින් සඳහා පාංශු සහ පස්වැඩ ප්‍රායෝගික පුහුණුව | 397,000.00 |
| ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයය | තාක්ෂණ පීඨයේ උපාධි අපේක්ෂකයින් සඳහා තරල යන්ත්‍ර විද්‍යාව ප්‍රායෝගික පුහුණුව | 1,581,500.00 |

## අනාගත සැලසුම්

නව සංකීර්ණයේදී සිසුන් බඳවා ගැනීම වසරකට **1000** ක් දක්වා වැඩි කිරීමට මොරටුව විශ්වවිද්‍යාලීය තාක්ෂණික ආයතනය සැලසුම් කර ඇත. එමනිසා මෙම ඉලක්කය සපුරා ගැනීම සඳහා බඳවා ගැනීම් ක්‍රමානුකූලව වැඩි කෙරෙනු ඇත.

අධ්‍යයන වැඩසටහන් මාර්ගගත ක්‍රමයට ලබාදීම සඳහා අවශ්‍ය මාර්ගෝපදේශ තත්ත්ව සහතික ඒකකය මඟින් සංවර්ධනය කර ඇත. අධ්‍යනාංශ සිය ජාතික මෙහෙවර සමාජීය සහ කාර්මික අවශ්‍යතා සමග අත්වැල් බැඳගනිමින් පශ්චාත් ඩිප්ලෝමා වැඩසටහන් හඳුන්වා දෙමින් ඉටු කිරීමට සැලසුම් සකස් කරමින් සිටියි.

## තාක්ෂණ ආයතන පහසුකම්

ආදායම් උත්පාදනය කිරීමේ අරමුණින් බහුකාර්ය ශාලාව, ශ්‍රවණාගාරය, මාණ්ඩලික සංවර්ධන මධ්‍යස්ථානය, තානායම් සහ සාප්පු සංකීර්ණය වෙළඳ දැන්වීම් මඟින් ප්‍රවර්ධනය කෙරේ.

සූර්යබල පද්ධතියක් ස්ථාපිත කිරීම සඳහා සහ විදුලිබිල පියවා ගැනීම සඳහා අරමුදල් උත්පාදනය කිරීමේ හැකියාව සොයාබැලීමට ශක්‍යතා අධ්‍යනයක් ආරම්භ කර ඇති අතර තාක්ෂණ ආයතනයේ සාප්පු සංකීර්ණයේ ඇති සියලු කඩසාප්පු සහ පොදු පහසුකම් මහජනතාවට කුලියට ලබා දීමට පියවර ගෙන ඇත.

# 02. ආයතනයේ අරමුණු

අරමුණ 01

සමාජයේ සහ කර්මාන්තකරණයේ අවශ්‍යතාවයන් සපුරාලිය හැකි මහත් වූ ශිෂ්‍ය ප්‍රජාවට නම්‍යතාවයෙන් ළඟා විය හැකි ඉගැන්වීමේ සහ කුසලතා පුහුණු කිරීමේ ක්‍රමවේදයක් නිර්මාණය කිරීම.

ප්‍රායෝගිකව උචිත වන පර්යේෂණ දිරිගැන්වෙන පරිසරයක් ස්ථාපිත කිරීම සහ නව්‍යකරණ සහ නිර්මාණශීලිත්වය සඳහා උනන්දු කරවීම.

අරමුණ 02

අරමුණ 03

අනෝන්‍ය වශයෙන් වාසිදායක ශක්තිමත් වූ හවුල් සබඳතාවයක් ගොඩනැගීම සහ කර්මාන්තයන්හි නියැලීම

සුදුසුකම් ඇති හා ධෛර්යමත් කාර්ය මණ්ඩලයක් ඇති කිරීම

අරමුණ 04

අරමුණ 05

ශිෂ්‍යයින්ගේ පූර්ණ සංවර්ධනයක් ප්‍රවර්ධනය කෙරෙන පරිසරයක් නිර්මාණය කිරීම

ආයතනයේ සියළුම ක්ෂේත්‍රයන්හි තත්ත්වය සහ කාර්යක්ෂමතාවය සහතික කෙරෙන කළමනාකරණ පද්ධතියක් වර්ධනය කිරීම.

අරමුණ 06

අරමුණ 07

ආයතනයේ මූල්‍ය ස්ථාවරත්වය වර්ධනය කිරීම.

යටිතල පහසුකම් උපරිමව උපයෝජනය කිරීමෙන් සහ විධිමත්ව නඩත්තු කිරීම තුළින් ඒවායේ කාර්යක්ෂම සහ තිරසාර උපයෝජනය ප්‍රවර්ධනය කිරීම.

අරමුණ 08

## 03. ජාතික තාක්ෂණ ඩිප්ලෝමා පාඨමාලාව සහ මොරටුව විශ්ව විද්‍යාලයේ තාක්ෂණික ආයතනය පිහිටුවීමේ ඉතිහාසය පිළිබඳ කෙටි හැඳින්වීමක්

ජාතික තාක්ෂණ ඩිප්ලෝමා පාඨමාලාවේ මුල් ආරම්භය මරදාන කණිෂ්ඨ කාර්මික විද්‍යාලය දක්වා දිවෙයි. ඒ එමගින් ලබා දුන් දැවුරුදු කණිෂ්ඨ කාර්මික නීලධාරී පාඨමාලාව හා ලන්ඩන් විශ්ව විද්‍යාලයේ ඉංජිනේරු උපාධිය සඳහා සිසුන් සූදානම් කරමින් ලබාදුන් සිවි අවුරුදු තාක්ෂණික ඩිප්ලෝමාව නිසාවෙනි. කණිෂ්ඨ තාක්ෂණික නිලධාරී පාඨමාලාව ඉතා හොඳ පිළිගැනීමකින් යුත් මැදි මට්ටමේ තාක්ෂණ පාඨමාලාවක් වූ අතර එය සම්පූර්ණ කල අයවලුන් රටෙහි ඉංජිනේරු අංශයේ දියුණුවට විශාල වශයෙන් දායක විය.

1960 වර්ශයේදී මොරටුව කටුබැද්දේ ප්‍රායෝගික තාක්ෂණ ආයතනය (Institute of Practical Technology) (IPT) පිහිටුවීමත් සමඟ කණිෂ්ඨ තාක්ෂණ නිලධාරී පාඨමාලාව මරදානේ සිට මොරටුවට මාරු කරන ලදි. ප්‍රායෝගික භාවිතය සඳහා අරමුණු කරගත් මධ්‍යම මට්ටමේ ඉංජිනේරු තාක්ෂණ පාඨමාලා සංවර්ධනය කිරීම හා ක්‍රියාත්මක කිරීම සඳහා කැනඩා රජයේ ආධාර මත ප්‍රායෝගික තාක්ෂණික ආයතනය ආරම්භ කරන ලදී.

ප්‍රායෝගික තාක්ෂණ ආයතනය 1966 වසරේදී ලංකා තාක්ෂණ විද්‍යාලය ලෙස උසස් කරන ලද අතර එහි සීඝ්‍ර පාඨමාලා විවිධාංගීකරණයක් සිදුවිනි. ලංකා තාක්ෂණ විද්‍යාලය මගින් පස් අවුරුදු තාක්ෂණ ඩිප්ලෝමා පාඨමාලාවක් ආරම්භ කළ අතර කණිෂ්ඨ කාර්මික නීලධාරී පාඨමාලාවට වසරක කර්මාන්තශාලා තුල පුහුණුවක් හදුන්වා දී එය ජාතික තාක්ෂණ ඩිප්ලෝමාවට (NDT) සුදුසුකම් ලබන තුන් අවුරුදු පාඨමාලාවක් බවට පත්කෙරිණි. 1972 දී ලංකා තාක්ෂණ විද්‍යාලය ශ්‍රී ලංකා විශ්වවිද්‍යාලයේ සරසවියක් ලෙස උසස් වී පසුව මොරටුව විශ්වවිද්‍යාලය ලෙස ක්‍රමයෙන් වර්ධනය විය. ඉන්පසු ජාතික තාක්ෂණ ඩිප්ලෝමාව උසස් අධ්‍යාපන අමාත්‍යාංශය වෙනුවෙන් මොරටුව විශ්ව විද්‍යාලය මගින් පවත්වාගෙන යන ලදි.

1987 වර්ශයේදී ජාතික තාක්ෂණ ඩිප්ලෝමාව 1978 අංක 16 විශ්ව විද්‍යාල පනතේ 29 (ඉ) වගන්තිය යටතේ මොරටුව විශ්ව විද්‍යාලයේ අභ්‍යන්තර පාඨමාලාවක් බවට පත්වුනු අතර ඒ සඳහා ඇතුලත් වීමේ අධ්‍යාපන සුදුසුකම ලෙසට අ.පො.ස. උසස් පෙළ පිලිගැනින. මූලික වශයෙන් ජාතික තාක්ෂණ ඩිප්ලෝමාව හා ඒ හා සමාන මට්ටමේ පාඨමාලා හැදෑරීම සඳහා මොරටුව විශ්ව විද්‍යාලය යටතේ ඇති ආයතනයක් ලෙස මොරටුව විශ්ව විද්‍යාලයේ තාක්ෂණ ආයතනය (ITUM) 2000 අංක 3 දරණ ආඥා පනත යටතේ 2000 වර්ශයේදී ආරම්භ කරන ලදී. මොරටුව විශ්ව විද්‍යාලයේ තාක්ෂණික ආයතනය කළමණාකරන මණ්ඩලයක් යටතේ ක්‍රියාත්මක වන අතර පාඨමාලා ස්වාධීනව සංවර්ධනය කිරීම සඳහා ආයතනය වෙනම ස්ථාපිත කිරීමට බලාපොරොත්තු වේ.

## ජාතික තාක්ෂණ ඩිප්ලෝමා පාඨමාලාව ගැන කෙටි හැඳින්වීමක්.

පාඨමාලාවේ මූලික පරමාර්ථය වන්නේ අපේ රටේ කර්මාන්ත සඳහා විවිධ අංශවලින් අවශ්ය ඉංජිනේරු ඩිප්ලෝමාධාරීන් බිහි කිරීමයි. ආයතනය විසින් ජාතික තාක්ෂණ ඩිප්ලෝමා වැඩසටහන විෂයයන් දහයකින් මෙහෙයවනු ලබන අතර එහි මුළු ඇතුලත් කරගැනීම් සංඛ්යාව 800 කි. ආයතන විසින් ලබාදෙන පාඨමාලා පහත පරිදි වේ.

| | | |
|---|---|---|
| රසායනික ඉංජිනේරු තාක්ෂණය | - | **50** |
| සිවිල් ඉංජිනේරු තාක්ෂණය | - | **200** |
| විදුලි ඉංජිනේරු තාක්ෂණය | - | **100** |
| විද්යුත් හා විදුලි සංදේශ ඉංජිනේරු තාක්ෂණය | - | **100** |
| සමුද්‍ර ඉංජිනේරු තාක්ෂණය | - | **20** |
| යාන්ත්‍රික ඉංජිනේරු තාක්ෂණය | - | **100** |
| නාවික අධ්‍යයන | - | **20** |
| බහුඅවයවික තාක්ෂණය | - | **50** |
| රෙදිපිළි හා ඇඳුම් තාක්ෂණය | - | **60** |
| තොරතුරු තාක්ෂණය | - | **100** |

මීට අමතරව, ත්‍රිවිධ හමුදාවට සහ විශ්ව විද්‍යාල අනධ්‍යයන කාර්ය මණ්ඩලයට උපරිම බඳවා ගැනීම් 5 ක් දක්වා වෙන් කෙරේ.

ජාතික තාක්ෂණ ඩිප්ලෝමා පාඨමාලාවට ඇතුලත් කරගැනීම විධිමත් ක්‍රියාවලියක් තුලින් සිදුකෙරේ. පසුගිය වසර තුනක් දක්වා උසස් පෙළ විභාග වලට පෙනී සිට එක් වරකදී භෞතික විද්‍යාව, රසායන විද්‍යාව, සංයුක්ත ගණිතය සහ උසස් ගණිතය යන විෂයයන්ගෙන් අවම වශයෙන් විෂයයන් තුනක් සඳහා සාමාන්‍ය සාමාර්ථ ලබාගත් සිසුන්ට මේ සඳහා අයදුම් කළ හැක. Z- ලකුණු, පදනම් කරගෙන තෝරා ගනු ලබන සිසුන් පසුව යෝග්‍යතා පරීක්ෂණයෙන් ලබාගත් ලකුණු මත තෝරා ගනු ලැබේ.

අංග සම්පූර්ණ ඩිප්ලෝමාධාරියකු ක්ෂේත්‍රයේ වෘත්තීය ඉංජිනේරුවෙකු හෝ කළමණාකරුවකු හා ශ්‍රම බලකාය අතර අතරමැදි සම්බන්ධීකාරකයකු වශයෙන් කටයුතු කිරීම අපේක්ෂා කරයි. මෙම භූමිකාව සඳහා ඩිප්ලෝමාධාරියකු වෘත්තීමය වශයෙන් සංවර්ධනය කිරීම සහ ඔහු/ඇයගේ සන්නිවේදනය සහ කළමනාකරණ කුසලතා වැඩි දියුණු කිරීම අවශ්‍ය වේ. ඔහු / ඇය තෝරාගත් අධ්‍යයන ක්ෂේත්‍රය තුළ අධ්‍යාපනය ලැබිය යුතු අතර එමඟින් ඔහුට / ඇයට වෘත්තීයඉංජිනේරුවරයාගේ නවෝත්පාදන / නිර්මාණ අගය කිරීමට හැකි වන අතර යටත් නිලධාරීන් සමඟ සන්නිවේදනය කර එම නවෝත්පාදන / නිර්මාණ යතාර්ථයක් බවට පත් කිරීමටත් හැකි විය යුතුය.

මේ අනුව පාඨමාලාව වසර දෙකක අධ්‍යයන කාලයකින් හා අර්ධ වාර්ෂික 6 කින් යුතු වසරක කාර්මික පුහුණුවකින් සමන්විත වේ. පළමු හා දෙවන අර්ධවර්ෂ අධ්‍යයන වාරයේ විෂය කොටස් ප්‍රධාන වශයෙන් නිර්මාණය කර ඇත්තේ මූලික විද්‍යාවන්හි ශිෂ්‍යයාගේ දැනුම සමාන කිරීම, ඒකාබද්ධ කිරීම සහ වැඩිදියුණු කිරීම සහ ඔහු / ඇය විසින් තෝරාගෙන ඇති විශේෂිත අධ්‍යයන පථය හඳුන්වා දීම සඳහා ය. ඉංජිනේරු පුහුණුව සඳහා අවශ්‍ය මූලික කුසලතා කිහිපයකටද මෙහිදී සිසුන් නිරාවරණය වනු ඇත (උදා: කර්මාන්තශාලා තාක්ෂණය හා ඉංජිනේරු ඇඳීම ).

පහත සඳහන් හේතු නිසා ඉංග්‍රීසි භාෂාව පළමු හා දෙවන අර්ධ වර්ෂ වල අනිවාර්යය විෂයකි.

i. ජාතික තාක්ෂණ ඩිප්ලෝමා පාඨමාලාව ඉංග්‍රීසි මාධ්‍යයෙන් පවත්වනු ලැබේ. බොහෝ සිසුන් අ.පො.ස. උසස් පෙළ දක්වා සිය අධ්‍යාපන කටයුතු සිංහල හෝ දෙමළ මාධ්‍යයෙන් සිදුකර ඇති නිසා ඉංග්‍රීසි භාෂා මොඩියුල සන්නිවේදන ප්‍රවීනතා වර්ධනය කිරීම ඉලක්ක කර ගනිමින් පිළියෙල කර ඇත.

ii. සන්නිවේදනය ඩිප්ලෝමාධාරියාගේ වෘත්තීය චර්යාවෙහි වැදගත් භූමිකාවක් හොබවයි. එබැවින් සිසුන් ඉංග්‍රීසි භාෂාව පිළිබඳ අවබෝධය කථන හැකියාව සහ වාර්තා රචනය පිලිබඳ සිය කුසලතාවයන් සංවර්ධනය කර ගතයුතු වේ.

තුන්වන හා හතරවන අර්ධවර්ෂ වල විෂය කොටස් සිසුන් විසින් තෝරාගන්නා ලද විෂය ක්ෂේත්‍රයෙහි ඉංජිනේරු සංසිද්ධි භාවිතයන් ප්‍රධාන වශයෙන් අඩංගු වේ.

පස්වන හා සයවන සයමාසික අදාල කර්මාන්තයෙහි ප්‍රායෝගික පුහුණුව ලබාගැනීම සඳහා වෙන්කෙරේ. ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු අධිකාරිය (NAITA) තාක්ෂණ ආයතනයේ (ITUM) පුහුණු ඉංජිනේරු සමග එක්ව පුහුණුව සඳහා ආයතන සපයා දීම සිදුකෙරේ.


විශ්ව විද්‍යාලය විසින් අනුමත කාර්ය සාධන ක්‍රමවේද අනුව වසර තුනක අධ්‍යාපනය සහ පුහුණුව සාර්ථකව අවසන් කළ සිසුන් සඳහා ජාතික තාක්ෂණ ඩිප්ලෝමා සහතිකය සාමාන්‍ය, සම්මාන හෝ විශිෂ්ඨතා සාමාර්ත සහිතව පිරිනැමේ.

ජාතික තාක්ෂණ ඩිප්ලෝමාධාරීන් සුදුසුකම් සපුරා වර්ශයක් ඇතුලත ඔවුන්ගේ සේවා නියුක්තතාව 100% බව පසුවිපරම් අධ්‍යනයන්ගෙන් හෙළිවී ඇත.

මොරටුව විශ්ව විද්‍යාලයේ තාක්ෂණ ආයතනයේ ක්‍රියාත්මක අධ්‍යාපන විෂය නිර්දේශය 2005 වර්ෂයේදී පළමු වසර සිසුන් සදහා හඳුන්වාදෙන ලද අතර 2006 වර්ෂයේදී දෙවන වසර සිසුන් සදහා හඳුන්වාදෙන ලදි. එහි අරමුණ කාර්මික ලෝකයේ වර්තමාන දියුණු තාක්ෂණ ක්‍රමවේදයන් ඒ හා සමානවම පවත්වා ගනිමින් තෝරාගත් අධ්‍යයන ක්ෂේත්‍ර වල සිසුන්ගේ දැනුම පුළුල් කිරීම වේ.

දීර්ඝ කාලයකට පසුව තාක්ෂණික ආයතනයේ (ITUM) ප්‍රතිස්ථාපන හා සංවර්ධන ව්‍යාපෘතිය මගින් ජාතික තාක්ෂණ ඩිප්ලෝමා විෂය නිර්දේශය සංවර්ධනය කිරීම හා යාවත්කාලීන කිරීම සිදුකළ අතර අධ්‍යයන කටයුතු **2018** වර්ෂයේ සිට වාර්ෂික පදනමින් සයමාසික පදනමට වෙනස් කරන ලදි.

## 4. සංවිධාන ව්‍යුහය – මොරටුව විශ්වවිද්‍යාලීය තාක්ෂණ ආයතනය



# 5. කළමණාකරණ මණ්ඩලයේ සාමාජිකයින්

| | | |
|---|---|---|
| 1. | ආචාර්ය සී එස් ලෙවන්ගමගේ මහතා | නිසි බලධාරි |
| 2. | එස් එච් එල් ගමගේ මහතා | උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්ගේ නියෝජිත |
| 3. | ඒ. ඩබ්ලිව් සෙනෙවිරත්න මහතා | නාවික අමාත්‍යාංශයේ ලේකම්ගේ නියෝජිත |
| 4. | ආර්.එම්.ඒ.පී. සමරදිවාකර මිය | ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරියේ සභාපතිගේ නියෝජිත |
| 5. | මහාචාර්ය එන්. කේ. වික්‍රමාරාච්චි | පීඨාධිපති, ඉංජිනේරු පීඨය, මොරටුව විශ්වවිද්‍යාලය |
| 6. | ඩී. පී. චන්ද්‍රසේකර මහතා | පීඨාධිපති, වාස්තු විද්‍යා පීඨය, මොරටුව විශ්වවිද්‍යාලය |
| 7. | මහාචාර්ය කල්‍යාණී පෙරේරා මිය | සභා නියෝජිත (**2020.02.22** සිට **2023.02.21** දක්වා) |
| 8. | මහාචාර්ය ඒ.එස්. කරුණානන්ද මහතා | සෙනෙට් නියෝජිත (**2020.07.22** සිට) |
| 9. | ජී.ජී. ජයරත්න මහතා | අධ්‍යාපන මණ්ඩලයේ නියෝජිත ITUM (**2020.10.12** සිට **2023.10.11** දක්වා) |
| 10. | ආචාර්ය එම්.සී.ඩබ්ලිව්. සෝමරත්න | අධ්‍යාපන මණ්ඩලයේ නියෝජිත ITUM (**2020.11.10** සිට **2023.11.09** දක්වා) |
| 11. | ආචාර්ය ප්‍රියන්ත ප්‍රේමකුමාර | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නියෝජිත (**2020.01.16** සිට **2023.01.15** දක්වා ) |
| 12. | ආචාර්ය චරිත් ජයතිලක | |
| 13. | එන්. කේ. අබේරත්න ඩයස් මිය | |

# 06. සබඳතා තොරතුරු


ලිපිනය තාක්ෂණික ආයතනය, මොරටුව විශ්වවිද්‍යාලය

දියගම

හෝමාගම

ශ්‍රී ලංකාව

දුරකතනය

| | |
|---|---|
| අධ්‍යක්ෂ | **0112124001** |
| පොදු | **0112124000** |
| ෆැක්ස් | **0112117030** |
| විද්‍යුත් ලිපිනය | director@itum.mrt.ac.lk |




# 07. කාර්ය මණ්ඩල සහ සිසුන් පිළිබඳ විස්තර

| අධ්‍යයන අංශ | පාඨමාලාව | මුළු ශිෂ්‍ය සංඛ්‍යාව | මුළු අධ්‍යයන කාර්ය මණ්ඩලය | | මුළු අනධ්‍යයන කාර්ය මණ්ඩලය |
|---|---|---|---|---|---|
| සිවිල් ඉංජිනේරු තාක්ෂණය | ජාතික තාක්ෂණික ඩිප්ලෝමා | | කථිකාචාර්යවරු<br>P – 08<br>V- 05 (part time)<br>C- 01 | උපදේශකවරු<br>T – 7 V - 7 | P- 07<br>Contract - 01 |
| යාන්ත්‍රික ඉංජිනේරු තාක්ෂණය සහ නාවුක අධ්‍යයනය | ජාතික තාක්ෂණික ඩිප්ලෝමා | 276 | කථිකාචාර්යවරු<br>P – 07<br>C- 02<br>V- 05 | උපදේශකවරු<br>T - 08<br>V – 25 | P- 29 |
| සමුද්‍ර ඉංජිනේරු අංශය | ජාතික තාක්ෂණික ඩිප්ලෝමා | | කථිකාචාර්යවරු<br>P – 01<br>V – 00<br>C- 01 | උපදේශකවරු<br>T – 00<br>NDA L-06<br>NDA I- 02 | P- 02<br>C- 02 |
| බහු අවයවික සහ රසායන ඉංජිනේරු තාක්ෂණය | ජාතික තාක්ෂණික ඩිප්ලෝමා | | කථිකාචාර්යවරු<br>P – 08<br>V – 03<br>C - 00 | උපදේශකවරු<br>T – 06<br>V – 03 | P- 10 |
| රෙදිපිළි සහ ඇඟලුම් තාක්ෂණය | ජාතික තාක්ෂණික ඩිප්ලෝමා | | කථිකාචාර්යවරු<br>P – 03<br>V – 02 | උපදේශකවරු<br>T – 02<br>V – 01 | P- 06<br>T- 01 |
| විදුලිය, ඉලෙක්ට්‍රොනික සහ විදුලි සන්දේශ ඉංජිනේරු තාක්ෂණය | ජාතික තාක්ෂණික ඩිප්ලෝමා | | කථිකාචාර්යවරු<br>P – 08<br>V – 02<br>T – 01 | උපදේශකවරු<br>T – 11<br>V – 09 | P- 10<br>T- 04 |
| අන්තර්විෂය මාලා අධ්‍යයනය | ජාතික තාක්ෂණික ඩිප්ලෝමා | Semester 1&2 – 1600<br>Semester 3 – 760<br>Semester 4 – 760 | කථිකාචාර්යවරු<br>P – 11<br>C - 01<br>V –12 | උපදේශකවරු<br>T – 01<br>V – 09 | P – 03 |
| තොරතුරු තාක්ෂණය | ජාතික තාක්ෂණික ඩිප්ලෝමා | | කථිකාචාර්යවරු<br>P – 06<br>V – 06 | උපදේශකවරු<br>T – 03<br>V –05 | P-01 |

P – ස්ථිර
C - කොන්ත්‍රාත්
T - තාවකාලික
V - බාහිර
NDA L -ජාතික ඩිප්ලෝමා සංගමය කථිකාචාර්යවරු
NDA I -ජාතික ඩිප්ලෝමා සංගමය උපදේශකවරු

# 7.1 සිසුන් පිළිබඳ විස්තර

ආයතනයට සිසුන් 800 ක් ඇතුළත් කරගනු ලබන අතර ක්ෂේත්‍ර 10 කින් සමන්විත වේ. එනම් රසායනික, පේෂකර්ම, පොලිමර්, සිවිල්, විදුලිය, විද්‍යුත් හා විදුලි සන්දේශ, නාවික, යාන්ත්‍රික හා නාවුක වේ.

| අධ්‍යයන අංශය | පාඨමාලාව | මාධ්‍යය | සිසුන් ඇතුලත් කිරීම 2020 | දෙවන සය මාසික සිසුන් | සිවිවන සය මාසික සිසුන් | කාර්මික පුහුණු සිසුන් | මුළු ඩිප්ලෝමාධාරී සිසුන් |
|---|---|---|---|---|---|---|---|
| සිවිල් ඉංජිනේරු තාක්ෂණ. | ජාතික තාක්ෂණික ඩිප්ලෝමා | ඉංග්‍රීසි | -- | 200 | 197 | 118 | 77 |
| යාන්ත්‍රික ඉංජිනේරු තාක්ෂණය සහ නාවුක අධ්‍යයනය | ජාතික තාක්ෂණික ඩිප්ලෝමා | ඉංග්‍රීසි | 100 | 101 | 99 | 76 | 52 |
| සමුද්‍ර අධ්‍යයන අංශය | ජාතික තාක්ෂණික ඩිප්ලෝමා | ඉංග්‍රීසි | 40 | 40 | 40 | 37 | 21 |
| බහු අවයවික සහ රසායන ඉංජිනේරු තාක්ෂණය | ජාතික තාක්ෂණික ඩිප්ලෝමා | ඉංග්‍රීසි | 100 | 100 | 89 | 57 | 40 |
| රෙදිපිළි සහ ඇඟළුම් තාක්ෂණය | ජාතික තාක්ෂණික ඩිප්ලෝමා | ඉංග්‍රීසි | 60 | 60 | 61 | 58 | 52 |
| විදුලිය, ඉලෙක්ට්‍රොනික සහ විදුලි සන්දේශ ඉංජිනේරු තාක්ෂණය | ජාතික තාක්ෂණික ඩිප්ලෝමා | ඉංග්‍රීසි | 200 | 200 | 200 | 120 | 74 |
| අන්තර්විෂය මාලා අධ්‍යයනය | ජාතික තාක්ෂණික ඩිප්ලෝමා | ඉංග්‍රීසි | 800 | 800 | 160 | | |
| තොරතුරු තාක්ෂණය | ජාතික තාක්ෂණික ඩිප්ලෝමා | ඉංග්‍රීසි | 100 | | 98 | | |
| **Total** | | | 1400 | 1501 | 944 | 466 | 316 |

## 7.2 අධ්‍යයන සහ අනධ්‍යන කාර්ය මණ්ඩල පිළිබඳ විස්තර (2020.12.31)

| කාර්ය මණ්ඩල වර්ගය | වැටුප් පරිමාණය | අනුමත සේවක සංඛ්‍යාව | පවතින සේවන සංඛ්‍යාව | පුරප්පාඩු |
|---|---|---|---|---|
| අධ්‍යයන කාර්ය මණ්ඩලය | U-AC 3 to U-AC 5 | 76 | 52 | 24 |
| | U-AC 1 to U-AC 2 | 46 | 38 | 08 |
| ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩලය | U-EX 1 to U-EX 3 (Administrative & Financial Staff) | 07 | 07 | - |
| | U-EX 1 to U-EX 3 (Other Executive Staff) | 01 | - | 01 |
| වෛද්‍ය නිළධාරී | U-MO 1 | 01 | - | 01 |
| අධ්‍යයන සහයක කාර්යය මණ්ඩලය | U-AS 1 | 07 | 02 | 05 |
| | U-AS 2,2 | 03 | 01 | 02 |
| තාක්ෂණික කාර්යය මණ්ඩලය | U- MT 1 | 38 | 18 | 20 |
| ලිපිකරු හා සමාන | U-MN 1 | 37 | 31 | 06 |
| | U-MN 2,3 | 05 | 03 | 02 |
| | U-MN 4 | 01 | 01 | - |
| ප්‍රාථමික කාර්ය මණ්ඩලය | U-PL 1 to U-PL 3 | 83 | 65 | 18 |
| එකතුව | | 305 | 218 | 87 |

# 08. පර්යේෂණ, නවෝත්පාදන සහ ප්‍රකාශන පිළිබඳ විස්තර

මොරටුව විශ්වවිද්‍යාලීය තාක්ෂණික ආයතනයේ කාර්යමණ්ඩලය විසින් සිදුකරනලද පර්යේෂණ වල සොයාගැනීම් දේශීයව සහ ජාත්‍යන්තරව ඉදිරිපත් කර ප්‍රසිද්ධ කර ඇත.

| කතෘ | පත්‍රිකාවේ මාතෘකාව | සම්මන්ත්‍රණය / ජර්නලය / පොත් / ප්‍රවේශ වූ දිනය |
|---|---|---|
| වීරසිංහ කේ.ඒ.බී, ගමගේ ජේ.සී.පී.එච්, ෆවුසියා එස්, තම්බිරත්නම් ඩී. පී | Experimental Investigation on Flexural Behaviour of Vertically-Curved Circular-Hollow Steel Sections Strengthened with Externally Bonded Carbon Fibre Reinforced Polymer, Engineering Structures. | 2020 |
| වීරසිංහ කේ.ඒ.බී, ගමගේ ජේ.සී.පී.එච්, තම්බිරත්නම් ඩී. පී, , ෆවුසියා එස් | Numerical Investigation on Flexural Behaviour of Vertically-Curved Circular-Hollow Steel Sections Strengthened with Externally Bonded Carbon Fibre Reinforced Polymer, Engineering Structures | 2020 |
| වීරසිංහ කේ.ඒ.බී, සජින්දන් ආර්, සහ ගමගේ ජේ.සී.පී.එච් | Experimental Investigation on Torsional Behaviour of Carbon Fibre Reinforced Polymer Strengthened Concrete Beams Curved in Horizontal Plane, The Annual Sessions, Structural Engineers Society, Sri Lanka. | 2020 |
| වී. එන්. කනන්ගොඩ ආරච්චි සහ භද්‍රානී තෝරදෙනිය | Impact of the Client's role on the performance of Government Funded Construction Projects. | ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය - **114** වන වාර්ෂික සැසිවාරය |
| සී. හේවාවසම්, යූ. එම්. අබේසිංහ, ඩී.ඩී.ජී.ඒ.ඩී.එස් සපරමාදු | Assessing factors affecting university student' preference of walking; comparing University of Moratuwa & Sri Jayewardenepura. | **13** වන ෆාරු ජාත්‍යන්තර සමුලුව- මොරටුව විශ්වවිද්‍යාලයය- ශ්‍රී ලංකාව<br>**2020** නොවැම්බර් **6, 7** |

# පර්යේෂණ, නවෝත්පාදන සහ ප්‍රකාශන පිළිබඳ විස්තර

| කතෘ | පත්‍රිකාවේ මාතෘකාව | සම්මන්ත්‍රණය / ජර්නලය / පොත් / ප්‍රවේශ වූ දිනය |
|---|---|---|
| කුමාරසිරි එල්. පී | A Study of the parallels in aims and expectancies between Sabaragamuwa and Veddha dancing tradition and their related dancers. | අස්පෘශ්‍ය සංස්කෘතික උරුමයන් පිළිබඳ ජාත්‍යන්තර සමුලුව- **2020** දෙසැම්බර් **18,19** |
| ඩී ඒ.ඩී දසනායක, ජේ. ඒ. එස් .ඩී. බන්ඩාර, එච්.පී. එන්. පෙරේරා | An Analysis of the Relationship between Anxiety and Coaching Behavior of National Level Contact Sports and Non - Contact Sports Male Athletes in Sri Lanka. | බහුවිනය ප්‍රවේශ පිළිබඳ ජාත්‍යන්තර සමුලුව- 2020 දෙසැම්බර් 8,9 |
| පී. ඩී. ආර් . දිලුෂිනී, ඩබ්. ආර්.එන්. නවෝදනී,තරංගිකා බඹරවානගේ සහ කේ.ඒ. සී. උදයකුමාර් | Soil Resistivity Analysis and Earth Electrode Resistance Determination | Electrical and Electronics Engineering (IOSR-JEEE) IOSR සඟරාව e-ISSN: 2278-1676, p-ISSN: 2320-3331, Volume 15, Issue 2 Ser. I (Mar – Apr 2020), PP 26-35 www.iosrjournals.org |
| මංජුල වික්‍රමතිලක | Non-Intrusive load monitoring: Recent developments and challenges | පරිගණක හා තාක්ෂණයේ දියුණුව පිළිබඳ ජාත්‍යන්තර සම්මන්ත්‍රණය (ICACT) – **2020**<br><br>කැළණිය විශ්වවිද්‍යාලයේ තාක්ෂණ පීඨය විසින් මාර්ගගත ක්‍රමයට සංවිධානය කරන ලදී. **2020** නොවැම්බර් **28** |
| කේ. ගලප්පත්ති, එස්. කුරුප්පු | A text mining approach to analyze trends in the IT industry job market through text extraction from images | පරිගණක හා තාක්ෂණයේ දියුණුව පිළිබඳ ජාත්‍යන්තර සම්මන්ත්‍රණය (ICACT) – 2020 **(මාර්ගගත)** 2020 නොවැම්බර් 28 දින පවත්වන ලදී. |
| ජී.ජී. ජයරත්න | Influence to fuel consumption with advanced technology in modern automobile construction | තාක්ෂණ ආයතනයේ (ITUM) පර්යේෂණ සම්මන්ත්‍රනය 2019 |

# පර්යේෂණ, නවෝත්පාදන සහ ප්‍රකාශන පිළිබඳ විස්තර

| කතෘ | පත්‍රිකාවේ මාතෘකාව | සම්මන්ත්‍රණය / ජර්නලය / පොත් / ප්‍රවේශ වූ දිනය |
|---|---|---|
| පී.ඩී.සී කුමාර | Implementation of a wireless distributed node-based system for monitoring, controlling and data logging of a Parabolic Trough Concentrator | ව්‍යවහාරික සහ ශුද්ධ විද්‍යා ජාත්‍යන්තර සමුලුව **2020** (ICAPS 2020 - කැළණිය) |
| එම්.එස්. අබේසේකර<br>ජී.කේ. ජයතුංග<br>ඩී. එම්. කේ. එන්. එල්. දිසානායක,<br>බී.එම්. ඩබ්ලිව්. පී. කේ. අමරසිංහ | Study on Fluidization Behaviour of Raw and Dry Sri Lankan Black Pepper | මොරටුව ඉංජිනේරු පර්යේෂණ සමුලුව **2020** (MERCon)<br><br>**6** වන ජාත්‍යන්තර බහු විනය ඉංජිනේරු පර්යේෂණ සමුළුව **27-30** ජූලි **2020** |
| මහේෂ් ජයවීර, හසිනි පෙරේරා, නිලන්ති බණ්ඩාර, ගිම්හානි ධනුෂිකා, බුද්ධික ගුණවර්ධන, චාන්දනී සෝමරත්න, ජගත් මනතුංග, | Migration of phthalates from PET water bottle in events of repeated uses and associated risk assessment | පරිසර විද්‍යාව සහ දූෂණය පර්යේෂණ<br>ISSN 0944-1344<br><br>Environ Sci Pollut Res<br>DOI 10.1007/s11356-020-09925-4<br>Accepted: 2020 ජූනි 29 |
| අමාලි ධනුෂ්කා වීරකෝන් | An Excellent Formative Assessment to Enhance Graduate Attributes: A Study with Polymer Technology Students | මොරටුව විශ්වවිද්‍යාලීය තාක්ෂණ ආයතනයේ (ITUM) POLYMERTECH 20” සභරාව **2020** මාර්තු **13** |
| අමාලි ධනුෂ්කා වීරකෝන්, මහාචාර්ය ලලින් කරුණානායක, ආචාර්ය දිල්හාර එදිරිසිංහ | Effects of Solvent System on the polyphenol extraction from Banana (Musa spp. Var. Ambul kesel) Pseudo-stem | පරිගණක හා තාක්ෂණයේ දියුණුව පිළිබඳ මාර්ගගත ජාත්‍යන්තර සම්මන්ත්‍රණය ICACT 2020<br><br>2020 නොවැම්බර් **28** |

# පර්යේෂණ, නවෝත්පාදන සහ ප්‍රකාශන පිළිබඳ විස්තර

| කතෘ | පත්‍රිකාවේ මාතෘකාව | සම්මන්ත්‍රණය / ජර්නලය / පොත් /<br>ප්‍රවේශ වූ දිනය |
|---|---|---|
| ආර්.එල්.පී. රාමසිංහ,<br>එන්.එම්.වී.කේ. ලියනගේ | Use of Acrylic Polymer modified Hydrophobic Nano-Silica in Reinforcement of XNBR Nano-Composites Designed for Glove Manufacturing | මොරටුව ඉංජිනේරු පර්යේෂණ සමුළුව 2020 (MERCon)<br><br>DOI: 10.1109/MERCon50084.2020.9185353 |
| ආර්.එල්.පී. රාමසිංහ | Use of Unannounced Quizzes at lectures to enhance academic performance, alongside increased lecture attendance in a second year Engineering course | ශ්‍රී ලංකාවේ උසස් අධ්‍යාපනය පිළිබඳ SLAIHEE සම්මන්ත්‍රණය **2020** |
| ඩබ්ලිව්. වී.ඩබ්ලිව්.එච්. වික්‍රමආරච්චි මහත්මිය<br><br>මහාචාර්ය එස්. වල්පලගේ<br><br>ආචාර්ය එස්.එම් එගොඩගේ මහත්මිය | Effect of particulate fillers on natural rubber/high-density polyethylene blends for roofing application | *Polymers and Polymer Composites"* සඟරාව |
| වී. ජී. පී. පඛසරා සහ<br>එම්.වයි. ඒ. පෙරේරා | Use of unannounced quizzes as<br>a formative assessment tool to improve engineering technology<br>student attainment | ශ්‍රී ලංකාවේ උසස් අධ්‍යාපනය පිළිබඳ සම්මන්ත්‍රණය 16 වන වාර්ෂික SLAIHEE සම්මන්ත්‍රණය ජූලි 24 |

# 09. වැඩසටහන්, සම්මන්ත්‍රණ සහ වැඩමුලු පිළිබඳ විස්තර

| | වැඩසටහන් / සම්මන්ත්‍රණ වැඩමුලු | පවත්වන ලද දින | සහභාගී වූවන් | වෙනත් කරුණු |
|---|---|---|---|---|
| පොලිමර් සහ රසායනික ඉංජිනේරු තාක්ෂණය | ගිලුණු නිෂ්පාදන නිෂ්පාදන ක්‍රියාවලිය සංවර්ධනය හා ප්‍රශස්තිකරණය (එක් දින වැඩමුළුව) | 2020 පෙබරවාරි 15 | සහභාගී වූවන් 25 | මෙය අංශයේ සාර්ථක කණ්ඩායම් වැඩකි. |
| තොරතුරු තාක්ෂණය | 99X තාක්ෂණය මඟින් තොරතුරු තාක්ෂණ කර්මාන්ත දැනුවත් කිරීම පිළිබඳ වැඩමුළුව | 2020 පෙබරවාරි 21 | ජාතික තාක්ෂණ ඩිප්ලෝමා, තොරතුරු තාක්ෂණ සිසුන් | වැඩමුළුවේදී මාතෘකා, තොරතුරු තාක්ෂණ කර්මාන්තයේ වැඩ කිරීම හා පවතින විවිධ රැකියා අවස්ථා, උපාධි අපේක්ෂකයින්ගේ කර්මාන්ත අපේක්ෂාවන් සහ අයදුම්පත් ලිවීම සහ මාර්ගගතව සිටීම සහ ප්‍රශ්නෝත්තර සැසිය සඳහා මාතෘකා ආවරණය කර ඇත. වැඩමුළුව අවසානයේ 99X තාක්ෂණය පිළිබඳ කාර්මික පුහුණුව අවසන් කළ සිමාවාසිකයින් දෙදෙනෙකුගේ අත්දැකීම් හුවමාරු කර ගැනීමේ සැසියක් පැවැත්විණි. |

# වැඩසටහන්, සම්මන්ත්‍රණ සහ වැඩමුලු පිළිබඳ විස්තර

| | වැඩසටහන් / සම්මන්ත්‍රණ වැඩමුලු | පවත්වන ලද දින | සහභාගී වූවන් | වෙනත් කරුණු |
|---|---|---|---|---|
| රෙදිපිළි සහ ඇඳුම් පැළඳුම් තාක්ෂණය | නැඟී එන තාක්ෂණ, ප්‍රවණතා සහ අවස්ථා | 2020 දෙසැම්බර් 23 | NSF මගින් පවත්වන ලදී | |
| | ශිෂ්‍ය කේන්ද්‍රීය ඉගෙනීම සඳහා මාර්ගගත පාඨමාලා සැලසුම් සහ ඇගයීම් ක්‍රම පිළිබඳ සැසිය | 2020 නොවැම්බර් 18 (මාර්ගගත) | සැමට මාර්ගගත සැසිය | ශිෂ්‍ය කේන්ද්‍රීය ඉගෙනීම සඳහා මාර්ගගත පාඨමාලා සැලසුම් සහ ඇගයීම් ක්‍රම පිළිබඳ සැසිය |
| | බුද්ධිමය දේපල හා තාක්ෂණ හුවමාරුව | 2020 ඔක්තෝබර් 24 ,31 සහ නොවැම්බර් 7 | ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයේ (IESL) සාමාජිකයින් සහ අනෙකුත් නව නිපැයුම්කරුවන් | බුද්ධිමය දේපල හා තාක්ෂණ හුවමාරුව |
| | ඔබේ ඉගැන්වීම වැඩි දියුණු කරන්නේ කෙසේද? මාර්ගගත සාකච්ඡාව | 15th Oct 2020 ඔක්තෝබර් 15 | විශ්වවිද්‍යාල ආචාර්යවරුන් | ඔබේ ඉගැන්වීම වැඩි දියුණු කරන්නේ කෙසේද? මාර්ගගත සාකච්ඡාව |
| | නවීකරණ රෙදිපිළි සහ ඇඟලුම් අතථ්‍ය වෙළඳ ප්‍රදර්ශනය | 2020 ඔක්තෝබර්15, 30 (අතථ්‍ය) | රෙදිපිළි වෙළඳ නාම/ කර්මාන්ත සහ විශ්ව විද්‍යාල | |

## වැඩසටහන්, සම්මන්ත්‍රණ සහ වැඩමුලු පිළිබඳ විස්තර

| | වැඩසටහන් / සම්මන්ත්‍රණ වැඩමුලු | පවත්වන ලද දින | සහභාගී වූවන් | වෙනත් කරුණු |
|---|---|---|---|---|
| කාර්ය මණ්ඩල සංවර්ධන කම්ටුව | දෙමළ භාෂාව | 2020 පෙබරවාරි සිට මාර්තු දක්වා to | අධ්‍යයන පරිපාලන කාර්ය මණ්ඩලය | |
| | මිනිස් ජීවිතයේ කලා කටයුතු | 26.09.2020 | අධ්‍යයන පරිපාලන කාර්ය මණ්ඩලය | සම්පත් දායකයින් - ආචාර්ය සුනිල් විජේසිරිවර්ධන කලණි දොඩන්තැන්න මහත්මිය ලක්නි කුමාරසිරි මහත්මිය |
| | විෂයමාලා සංශෝධන වැඩමුළුව | 05.12.2020 | අධ්‍යයන ශිෂ්‍ය නියෝජිතයින් ආදි ශිෂ්‍ය සංගමයේ සාමාජිකයින් | |

# 10. ශිෂ්‍ය ක්‍රියාකාරකම්

## තෛපොන්ගල් උත්සවය 2020



## සිසුන්ගේ සෞන්දර්යාත්මක ක්‍රියාකාරකම්



# 11. 2020 වර්ෂයේදී.....

මොරටුව විශ්වවිද්‍යාලීය තාක්ෂණික ආයතනයේ අධ්‍යාපනික පරිපාලන ව්‍යුහය ප්‍රතිව්‍යුහගත කිරීම.



- පවතින ස්ථාවර කාරක සභා ප්‍රතිව්‍යුහගත කිරීම සහ ඒවායේ යොමු කොන්දේසි නිර්වචනය කිරීම
- ලබා දී ඇති යොමු කොන්දේසි සමඟ නව ස්ථාවර කමිටු සහ ඒකක පිහිටුවීම
- කොවිඩ් -19 වසංගත තත්ත්වය සමඟ අධ්‍යයන වැඩසටහන අඛණ්ඩව පවත්වාගෙන යාම
- ජාතික තාක්ෂණ ඩිප්ලෝමා අපේක්ෂක 2019/2020 කණ්ඩායමේ ආරම්භක උත්සවය COVID-19 සෞඛ්‍ය මාර්ගෝපදේශ යටතේ 2020 ඔක්තෝබර් 05 දින පැවැත්විණි.
- කෝවිඩ් -19 වසංගතය සහ වෙනත් හදිසි අවස්ථා වලදී ඇති වන තත්ත්වයන් සමඟ කටයුතු කිරීම සඳහා මොරටුව විශ්වවිද්‍යාලීය තාක්ෂණ ආයතනයේ හදිසි කළමනාකරණ ඒකකය ස්ථාපිත කර ඇත.
- තාක්ෂණ ආයතනයේ තත්ත්ව සහතික කිරීමේ ඒකකය හරහා අධ්‍යයන වැඩසටහන මාර්ගගතව ලබා දීම සඳහා මාර්ගෝපදේශ සකස් කිරීම.
- තාක්ෂණ ආයතනයේ තොරතුරු තාක්ෂණ පහසුකම් සංවර්ධන ඒකකය ස්ථාපිත කර ඇති අතර එය අධ්‍යාපන කටයුතු මාර්ගගතව බෙදා හැරීම සම්බන්ධ සියලු කටයුතු සඳහා සහාය වේ. සෑම අංශයකම දේශන කාමර අධ්‍යාපන කටයුතු මාර්ගගතව බෙදා හැරීම සඳහා පහසුකම් සැලසීම ආරම්භ කර ඇත. තාක්ෂණ ආයතනය සඳහා කළමණාකරන තොරතුරු පද්ධතිය සංවර්ධනය කිරීම සඳහා සාකච්ඡා ආරම්භ කර ඇත.
- තාක්ෂණ ආයතනයේ අධ්‍යයන වැඩසටහන අධ්‍යයන වර්ෂ දෙක සඳහාම මාර්ගගත බෙදා හැරීමේ ආකාරයෙන් සිදු කෙරේ.
- තෝරාගත් අධ්‍යයන ක්ෂේත්‍ර වල සිසුන් පුහුණු කිරීම සඳහා “ගෙදර සිට වැඩ කිරීම” සංකල්පය ස්ථාපිත කිරීමට අධ්‍යයන මණ්ඩලයේ විශේෂ අනුමැතිය ලබාගෙන ඇත. තාක්ෂණ ආයතනයේ පුහුණු ඒකකය මාර්ගෝපදේශ සකස් කර ඇත.
- පවතින වාතාවරණය හේතුවෙන් කුඩා ශිෂ්‍ය කණ්ඩායම් සඳහා (අධ්‍යයන ක්ෂේත්‍රය අනුව) ඔවුන්ගේ මොඩියුල ප්‍රායෝගික, ක්ෂේත්‍ර වැඩ සහ විභාග පැවැත්වීම සඳහා අධ්‍යයන වැඩසටහනක් ආරම්භ කර ඇත. තාක්ෂණ ආයතනයේ හදිසි කළමනාකරණ ඒකකය විසින් සකස් කරන ලද සෞඛ්‍ය නියමාවලිය විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් අනුමත කර ඇත.

විධිමත් පාලනයක් පවත්වා ගන්නා අතරම සිසුන් තුල  යහපත් ආකල්ප ගොඩනැංවීමට ක්‍රියාකිරීම

- සෑම ජාතික විශ්ව විද්‍යාලයක්ම කණ්ඩායම් අතර විටින් විට නවක වදය හා ගැටුම් ඇතිවීමේ  ගැටලුවකට මුහුණ දෙනු ලබයි. මෙය සාමාන්‍යය තත්වයට  තරමක් අභිබවා ගොස් ඇති බැවින් වැඩිදුර ක්‍රියාමාර්ග අවශ්‍ය වේ.

- සිසුන්ගේ ප්‍රවාහන මාර්ගෝපදේශන ක්‍රියාකාරකම්, උපදේශන වැඩසටහන් සහ සිසුන්ගේ යහපත් ආකල්ප ඇති කිරීම සඳහා වෙනත් අදාළ වැඩ සටහන් පැවැත්වීම සඳහා ශිෂ්‍ය මාණ්ඩලික සංවර්ධන ඒකකය (SSDU) නැවත සකස් කර ඇත.

- මොරටුව විශ්වවිද්‍යාලීය තාක්ෂණ ආයතනය ප්‍රදර්ශන පැවැත්වීම සඳහා තාක්ෂණ ආයතනය ප්‍රදර්ශන කමිටුව පිහිටුවන ලදී. මත්ද්‍රව්‍ය වැනි නීති විරෝධී සමාජ ඇබ්බැහි වීම් කෙරෙහි ශිෂ්‍ය අවධානය යොමු නොවී සිසුන්ගේ සියුම් කුසලතා සහ නව නිපුණතා කුසලතා වර්ධනය කර ගැනීමට මෙය උපකාරී වේ.

- තාක්ෂණ ආයතනය තුල  විශේෂයෙන් නවක සිසුන් විශ්වවිද්‍යාල පරිසරයට හුරු වන කාල සීමාව තුළදී ශිෂ්‍ය හිංසනය තුරන් කිරීම සඳහා නවක වද විරෝධී කමිටුව පිහිටුවන ලදී.

මූල්‍ය ස්ථාවරත්වය සහ ආදායම් උත්පාදනය

- මහජනතාව සඳහා අභ්‍යන්තර සම්පත් ප්‍රවර්ධනය කරමින් ආදායම් උත්පාදනය සඳහා තාක්ෂණ ආයතනය පහසුකම් ප්‍රවර්ධන හා කළමනාකරණ ඒකකය (ITUM-FP & MU) පිහිටුවීම.
- කාර්මික පරීක්ෂණ, කෙටි පාඨමාලා සහ පුහුණු වැඩසටහන් පැවැත්වීමට කාර්ය මණ්ඩලය දිරිමත් කිරීම. විශේෂයෙන් රටේ පවතින වාතාවරණය හේතුවෙන් මාර්ගගත වැඩසටහන් දිරිමත් කරන ලදී.
- කෙටි පාඨමාලා බෙදා හැරීම ප්‍රමිතිකරණය කිරීම සඳහා කෙටි පාඨමාලා සමාලෝචන කමිටුවක් පිහිටුවීම.

**ජාතික තාක්ෂන ඩිප්ලෝමා වැඩසටහන ප්‍රතිව්‍යුහගත කිරීම සහ ඩිප්ලෝමාධාරීන් සඳහා රැකියා අවස්ථා සංවර්ධනය කිරීම.**

- ඉහළම SLQF පිළිගැනීම ලබා ගැනීම සඳහා වර්තමාන වසර 3 ජාතික තාක්ෂනික ඩිප්ලෝමා වැඩසටහන ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා කමිටුවක් පත් කරන ලදී. සෙනෙට් සභා නිර්දේශ මත පදනම්ව දැනට පවතින ජාතික තාක්ෂනික ඩිප්ලෝමා විෂය මාලාව සංශෝධනය කිරීම මේ වන විටත් ආරම්භ කර ඇත.

- "ඉංජිනේරු තාක්ෂණවේදීන්ගේ වැඩසටහන සිඩ්නි ගිවිසුමට අනුව සංවර්ධනය කිරීම සහ සිතියම් ගත කිරීම" පිළිබඳ වැඩමුළුව 2020 දෙසැම්බර් 05 දින පැවැත්විණි. සම්පත්දායකයා වූයේ මොරටුව විශ්ව විද්‍යාලයේ මහාචාර්ය කේපී කරුණාදාස මහතාය. සිසුන්, විද්වතුන්, ජාතික තාක්ෂන ඩිප්ලෝමා ආදි ශිෂ්‍යයින්ගේ නියෝජනය ප්‍රධාන පාර්ශවකරුවන් වශයෙන් මෙම වැඩමුළුව සඳහා සහභාගී වී ඇත.
- මොරටුව විශ්වවිද්‍යාලීය තාක්ෂණ ආයතනයේ ඉහළ මට්ටමේ උපාධි පාඨමාලා (මොරටුව විශ්ව විද්‍යාලය හරහා වාහක මාවත ස්ථාපිත කිරීම) හැදෑරීම පිළිබඳව අධ්‍යයන මණ්ඩලයේ විශේෂ රැස්වීමක් පැවැත්විණි. මොරටුව විශ්ව විද්‍යාලයේ අනුමැතිය සඳහා සංකල්ප පත්‍රයක් ඉදිරිපත් කර ඇත.

# 12. යටිතල පහසුකම් සංවර්ධනය කිරීම 2020



- ප්‍රධාන ගොඩනැගිල්ල හා යාන්ත්‍රික ඉංජිනේරු තාක්ෂණ අංශය සම්බන්ධ කරන වර්ෂා ආරක්ෂක වහලක් ඉදිකිරීම අවසන් කර ඇත.

- ආපනශාලාව සහ නේවාසිකාගාර අතර ඇවිදින මං තීරුවේ (බිම් ශූන්‍ය මට්ටම) රබර් බුමුතුරුණු සවි කිරීම අවසන් කර ඇත. සිසුන් වාර්තා කළ පරිදි වර්ෂාව පවතින අවස්ථා වලදී ලිස්සන සුළු ප්‍රදේශ හේතුවෙන් අනතුරු කිහිපයක් සිදු වී ඇත.

- සියළුම යටිතල පහසුකම් සැලසුම් කිරීමේ හා සංවර්ධන කටයුතු සිදු කිරීම සඳහා තාක්ෂණ ආයතනයේ සැලසුම් හා සංවර්ධන ඒකකය ස්ථාපිත කර ඇත.

- මොරටුව විශ්වවිද්‍යාලීය තා තාක්ෂණ ආයතනයේ විහාග ශාලා ඉදිකිරීම සඳහා අඩු වියදම් විකල්පයක් යෝජනා කර ඇත. සැලසුම් සකස් කිරීම සිදු කෙරෙමින් පවතී.

## 13. පුනරාවර්ථන වියදම් විස්තරය

| විෂයය | 2019 (රු) | 2020 (රු) |
|---|---|---|
| අ) සේවක පාරිශ්‍රමික | **334,971,926.00** | 329,498,875.00 |
| ආ) ගුවන් වියදම් | **98,657.00** | 27,923.00 |
| ඇ) සැපයුම් | **9,151,475.00** | 6,688,738.00 |
| ඈ) නඩත්තු | **9,044,461.00** | 7,482,974.00 |
| ඉ) ගිවිසුම් හා සේවා | **92,887,175.00** | 87,718,257.00 |
| ඊ) වෙනත් | **10,948,812.00** | 9,729,875.00 |
| එකතුව | **457,062,506.00** | **441,146,642.00** |

## 14. ප්‍රාග්ධන වියදම් විස්තරය

| විෂයය | 2019 (රු) | 2020 (රු) |
|---|---|---|
| අ) ලී බඩු විද්‍යාගාරසහ කාර්යාල උපකරණ අත්පත්කර ගැනීම | **761,260.00** | 3,369,988.00 |
| ආ) යන්ත්‍ර සහ පිරියත අත්පත් කර ගැනීම | **46,820.00** | |
| ඇ) ගොඩනැගිලි හා ව්‍යුහයන් අත්පත්කර ගැනීම | | |
| ඈ) වෙනත් | **1,627,943.00** | 176,182.00 |
| එකතුව | **2,436,023.00** | **3,546,170.00** |

## 15. මූල්‍ය ප්‍රගතිය පිළිබඳ විස්තරය (වියදම්)

| | 2020 වර්ෂයේ ප්‍රතිපාදන(රු) | 2020 වර්ෂයේ වියදම්(රු) | ඉතිරිකිරීම්/අතිරික්තය(රු) |
|---|---|---|---|
| අ)ව්‍යාපෘති පුනරාවර්ථන වියදම් | 425,896,000.00 | 441,146,642.00 | -15,250,642.00 |
| ආ) ප්‍රාග්ධන පුනරාවර්තන වියදම් | 1,500,000.00 | 3,546,170.00 | -2,046,170.00 |

| | | | |
|---|---|---|---|
| එකතුව | **427,396,000.00** | **441,322,824.00** | **-17,296,812.00** |

## *16. මූල්‍ය ප්‍රගතියේ විස්තර (උත්පාදිත ආදායම)*

| ආදායම් මූලාශ්‍රය | 2020 වර්ෂය සඳහා ප්‍රතිපාදන | 2020 වර්ෂයේ රැස්කිරීම් | ඌනතාවය/අතිරික්තය |
|---|---|---|---|
| අ. අභ්‍යන්තර ආදායම් | 8,990,000.00 | 13,686,358.00 | 4,696,358.00 |
| එකතුව | **8,990,000.00** | **13,686,358.00** | **4,696,358.00** |

## *17. මූල්‍ය කාර්යසාධන විශ්ලේෂණය - 2020*

| විෂය | සූත්‍රය | ශිෂ්‍යයකු සඳහා වියදම(රු) |
|---|---|---|
| අ) ශිෂ්‍යයකු සඳහා පුනරාවර්ථන වියදම | පුනරාවර්ථන වියදම/ශිෂය සංඛ්‍යාව | 215,614.19 |
| ආ) ශිෂ්‍යයකු සඳහා ප්‍රාග්ධන වියදම | ප්‍රාග්ධන වියදම/ශිෂ්‍ය සංඛ්‍යාව | 1,733.22 |
| එකතුව | | **217,347.42** |

# *18. තිරසර සංවර්ධන අරමුණු*

**පෙරවදන**

**මෙම වාර්තාව මූල්‍ය චක්‍රලේඛ අංක 01/2018 හි අවශ්‍යතාවයක් ලෙස මොරටුවා තාක්ෂණ ආයතනයේ (ITUM) තිරසාර සංවර්ධන අරමුණු (SDGs) ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් සලකා බැලිය යුතු කරුණු සම්බන්ධව සාරාංශ කරයි. විගණන කමිටුවේ 41 වන රැස්වීමේ නිර්දේශයට අනුව 4 වන වගන්තිය තිරසාර සංවර්ධන අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා සලකා බැලිය යුතු කරුණු යටතේ ක්‍රියාත්මක වීමට තිරසාර සංවර්ධන ඉලක්ක පිලිබඳ SDG පිළිබඳ කමිටුවක් 2011.02.11 දින පිහිටුවන ලදී. අනපේක්ෂිත කොවිඩ් -19 වසංගත රෝගී තත්වය හේතුවෙන් 2020 වර්ෂය අනෙකුත් උසස් අධ්‍යාපන ආයතන මෙන්ම තාක්ෂණික ආයතනය සඳහා අභියෝගාත්මක වසරකි. මෙම වාර්තාව මගින් අපගේ ශක්තීන් හා දුර්වලතා සහ වසංගත කාල පරිච්ඡේදය තුළ අප දිගටම ක්‍රියා කළ යුතු ආකාරය සහ අනාගතයේදී එවැනි තත්වයක දී මුහුණ දීම සඳහා අප විසින් කළ යුතු දේ ඉස්මතු කරනු ඇත.**

# 1. තිරසර සංවර්ධන ඉලක්ක 04 හි ගුණාත්මක අධ්‍යාපනය

## හැඳින්වීම

2030 න්‍යාය පත්‍රයට ඉලක්ක 169 ක් සහිත අභිලාෂක තිරසාර සංවර්ධන ඉලක්ක 17 ක් ඇතුළත් වේ. තිරසාර සංවර්ධන ඉලක්ක අංක 04 - සියල්ලන්ටම ඇතුළත් හා සාධාරණ ගුණාත්මක අධ්‍යාපනයක් සහතික කිරීම සහ සැමට ජීවිත කාලය පුරාම ඉගෙනීමේ අවස්ථා ප්‍රවර්ධනය කිරීම, ගුණාත්මක අධ්‍යාපනය විශ්වවිද්‍යාල හා උසස් අධ්‍යාපන ආයතන සමඟ සෘජුවම සම්බන්ධ වේ. ඒ අනුව, මෙම වාර්තාව මූලික වශයෙන් හඳුනාගෙන ඇත්තේ අංක 01/2018 මුදල් චක්‍රලේඛ ලිපියේ හඳුනාගෙන ලැයිස්තුගත කර ඇති ප්‍රධාන ප්‍රතිපත්ති හතරට ආමන්ත්‍රණය කරමිනි.

1. උසස් අධ්‍යාපනයට ප්‍රවේශය
2. උසස් අධ්‍යාපනයේ ගුණාත්මකභාවය හා අදාළත්වය
3. කළමනාකරණ පද්ධතිවල ප්‍රමාණවත් බව
4. පර්යේෂණ, නවෝත්පාදන සහ දැනුම මාරු කිරීම

## *2. තිරසර සංවර්ධන ඉලක්ක (SDG) ක්‍රියාත්මක කිරීම හා සාක්ෂාත් කර ගැනීම*

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (යූජීසී) විසින් නිර්දේශ කර ඇති පරිදි ඉහත සඳහන් ප්‍රධාන ප්‍රතිපත්ති හතර තාක්ෂණික ආයතනය විසින් සැලසුම් කර හෝ ක්‍රියාත්මක කර ඇති ආකාරය මෙම කොටසින් සාරාංශ ගත කෙරේ. මෙහි ප්‍රතිපලයක් ලෙස, අදාල ප්‍රතිපත්ති මඟින් අපේක්ෂිත තිරසාර සංවර්ධන ඉලක්ක අංක 4 සහ 9.5 හි 9.3, 4.4, 4.5 සහ 4.A ඉලක්ක ආවරණය කරනු ඇත. මෙම ඉලක්ක පහත ලැයිස්තුගත කර ඇත (DCS 2017).

ඉලක්කය **4.3:** 2030 වන විට සියලුම කාන්තාවන්ට සහ පිරිමින්ට දැරිය හැකි සහ ගුණාත්මක වූ තාක්ෂණික, වෘත්තීය හා තෘතීයික අධ්‍යාපනය සඳහා සමාන ප්‍රවේශයක් සහතික කිරීම.(විශ්වවිද්‍යාල ද ඇතුලත් ව)

ඉලක්කය **4.4:** 2030 වන විට රැකියා අවස්ථා යහපත් රැකියා සහ ව්‍යවසායකත්වය සඳහා තාක්ෂණික හා වෘත්තීය කුසලතා ඇතුළුව අදාළ කුසලතා ඇති තරුණ හා වැඩිහිටියන්ගේ සංඛ්‍යාව සැලකිය යුතු ලෙස වැඩි කිරීම.

ඉලක්කය **4.5:** 2030 වන විට, අධ්‍යාපනයේ ස්ත්‍රී පුරුෂ විෂමතා තුරන් කිරීම සහ ආබාධිත පුද්ගලයින්, ආදිවාසීන් සහ අවදානමට ලක්විය හැකි අවස්ථාවන්හි සිටින ළමුන් ඇතුළුව සියල්ලන් සඳහා සියලු මට්ටමේ අධ්‍යාපන හා වෘත්තීය පුහුණුව සඳහා සමාන ප්‍රවේශයක් සහතික කිරීම.

ඉලක්කය **4.A:** ළමයින්, ආබාධිතභාවයට පත් වූවන් සහ ස්ත්‍රී පුරුෂ භාවය පිළිබඳ සංවේදී කරුණු ද සැලකිල්ලට ගෙන අධ්‍යාපන පහසුකම් ගොඩනැගීම සහ වැඩිදියුණු කිරීම සහ සැමට සුරක්ෂිත, සාමකාමී ඵලදායී ඉගෙනුම් පරිසරයක් ලබා දීම.

ඉලක්කය **9.5:** විද්‍යාත්මක පර්යේෂණ වැඩි දියුණු කිරීම, සෑම රටකම කාර්මික අංශවල තාක්ෂණික හැකියාවන් වැඩිදියුණු කිරීම, විශේෂයෙන් සංවර්ධනය වෙමින් පවතින රටවල්, 2030 වන විට නවෝත්පාදනයන් දිරිගැන්වීම සහ මිලියනයකට ජනතාවකට පර්යේෂණ හා සංවර්ධන සේවකයින්ගේ සංඛ්‍යාව පුද්ගලයින් මිලියනයකට සැලකිය යුතු ලෙස වැඩි කිරීම සහ රාජ්‍ය හා පෞද්ගලික පර්යේෂණ සහ සංවර්ධන වියදම්.


## 2.1 උසස් අධ්‍යාපනයට ප්‍රවේශය

තාක්ෂණික ආයතනය නව ස්ථානය වන දියගම පරිශ්‍රය වෙත ගෙන යාමෙන් පසු සෑම වසරකම සිසුන් බඳවා ගැනීමේ ප්‍රගතිය 1 වන වගුවේ දැක්වේ. තවද, රූප සටහන 1 සහ වගුව 2 මඟින් එක් එක් විශය සඳහා සිසුන් ඇතුළත් කර ගැනීම සහ 2017 වර්ෂය මත පදනම්ව පිළිවෙලින් සෑම වසරකම සිසුන් වැඩි කිරීමේ ප්‍රතිශතය පැහැදිලි කරයි. තාක්ෂණික ආයතනය යනු මොරටුව විශ්වවිද්‍යාලය සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ ඇති ආයතනයකි. රාජ්‍ය ආයතනයක් ලෙස එහි සිටින සියලුම ඩිප්ලෝමා සිසුන්ට නොමිලේ අධ්‍යාපනය ලබා දෙයි. මෙය ඉහත ලැයිස්තුගත ඉලක්ක සපුරා ගනිමින් දැරිය හැකි ගුණාත්මක තාක්ෂණික අධ්‍යාපනයක් සඳහා පුරුෂයින්ට හා කාන්තාවන්ට වෙනස් කමකින් තොර වූ ප්‍රවේශයක් ලබා දෙයි.

කෙසේ වෙතත්, සිසුන්ගේ බඳවා ගැනීම් වැඩිවීමත් සමඟ වැඩසටහනේ ගුණාත්මකභාවය පවත්වා ගැනීම සහ වැඩසටහනේ තිරසාර සංවර්ධනයක් ළඟා කර ගැනීම සඳහා අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලය වැඩි කිරීම අවශ්‍ය වේ.

වගුව 1: ජාතික තාක්ෂණික ඩිප්ලෝමා වැඩසටහනට සිසුන් ඇතුළත් කර ගැනීමේ ප්‍රගතිය

| බඳවා ගැනීම | වර්ෂය | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | 2017 | වැඩි වීම (%) | 2018 | වැඩි වීම (%) | 2019 | වැඩි වීම (%) | 2020 | වැඩි වීම (%) |
| පළමු වසර | 350 | - | 480 | 37 | 800 | 67 | 800 | - |
| දෙවන වසර | 350 | - | 350 | - | 480 | 37 | 800 | 67 |
| තුන්වන වසර | 350 | - | 350 | - | 350 | - | 480 | 37 |




රූපය 1: සෑම අංශයක් සඳහාම සිසුන් බඳවා ගැනීමේ ප්‍රගතිය:

**CH -** රසායනික
**CI -** සිවිල්
**EL -** විදුලි
**E -** ඉලෙක්ට්‍රොනික්
**PT -** පොලිමර්
**ME -** යාන්ත්‍රික
**MT -** මැරීන්
**NS -** නාවික
**TT -** රෙදිපිලි
**IT -** තොරතුරු තාක්ෂණ.

වගුව **2:** එක් එක් විෂය ධාරාවන් සඳහා සිසුන් බඳවා ගැනීමේ ප්‍රතිශතය වැඩි කිරීම

| විෂය | වර්ෂය | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | 2017 | වැඩි වීම (%) | 2018 | වැඩි වීම (%) | 2019 | වැඩි වීම (%) | 2020 | වැඩි වීම (%) |
| රසායනික | 25 | - | 30 | 20 | 50 | 100 | 50 | 100 |
| සිවිල් | 80 | - | 120 | 50 | 200 | 150 | 200 | 150 |
| විදුලි | 40 | - | 60 | 50 | 100 | 150 | 100 | 150 |
| ඉලෙක්ට්‍රොනික් | 40 | - | 60 | 50 | 100 | 150 | 100 | 150 |
| යාන්ත්‍රික | 60 | - | 80 | 33 | 100 | 67 | 100 | 67 |
| නාවුක | 15 | - | 20 | 33 | 20 | 33 | 20 | 33 |
| නාවික | 15 | - | 20 | 33 | 20 | 33 | 20 | 33 |
| පොලිමර් | 25 | - | 30 | 20 | 50 | 100 | 50 | 100 |
| රෙදිපිලි | 50 | - | 60 | 20 | 60 | 20 | 60 | 20 |
| තොරතුරු තාක්ෂණ | - | - | - | - | 100 | - | 100 | 0 |
| **Total** | **350** | **-** | **480** | **37** | **800** | **67** | **800** | **0** |

## 2.2 උසස් අධ්‍යාපනයේ ගුණාත්මකභාවය හා අදාළත්වය

මොරටුව විශ්වවිද්‍යාල තාක්ෂණික ආයතනය නැවත ස්ථානගත කිරීම මඟින් සිසුන්ට සුවපහසු දේශන ශාලා, නව උපකරණ සහිත විද්‍යාගාර, පුස්තකාලය, අංගසම්පූර්ණ ව්‍යායාම මධ්‍යස්ථානය සහ විවේකී පරිසරය තුළින් ගුණාත්මක හා දැරිය හැකි අධ්‍යාපනයක් ලබා දීමට අවස්ථාව ලබා දී තිබේ. තවද, වගු අංක 1 සහ 2 හි පෙන්වා ඇති පරිදි ජාතික තාක්ෂණ ඩිප්ලෝමා පාඨමාලාව හදාරන සිසුන් සංඛ්‍යාව වැඩි කිරීමට මෙමඟින් හැකියාව ලැබේ. එපමණක් නොව, සෞන්දර්යාත්මක අධ්‍යයන සහ ක්‍රීඩා අධ්‍යයන මොඩියුල මඟින් සිසුන්ගේ ජීවන රටාව සහ ගුණාත්මකභාවය ඉහළ නැංවීමට උපකාරී වේ. ඉගෙනීම මෙන් ම මෙම මොඩියුලයන් යටතේ සංවිධානය කර ඇති සිදුවීම් රටේ සෑම දිශාවකින්ම පැමිණෙන සිසුන් සමඟ සමාජ සම්බන්ධතාවය වැඩි දියුණු කිරීමට උපකාරී වේ.

කෙසේ වෙතත් අනපේක්ෂිත ලෙස කොවිඩ් -19 වසංගත තත්ත්වය ඇති වීම හේතුවෙන් 2020 වර්ෂය අනෙකුත් උසස් අධ්‍යාපන ආයතනවලට මෙන්ම තාක්ෂණික ආයතනයට ද අභියෝගාත්මක වසරකි. පළමු වරට මාර්ගගත (online) ඉගැන්වීම් හා ඉගෙනුම් (T & L) පරිසරයට ඇතුළු වූ සමහර කාර්ය මණ්ඩල සාමාජිකයින්ට සහ සියලුම සිසුන්ට පාහේ අභියෝගාත්මක කාල පරිච්ඡේදයකට මුහුණ දීමට සිදුවිය. ඒ අනුව, මෙම වාර්තාව මඟින් අපගේ ශක්තීන් සහ කොවිඩ් -19 වසංගත කාල පරිච්ඡේදය තුළ අත්විඳින ලද අපගේ දුර්වලතා සහ මාර්ගගත දේශන පැවැත්වීමේ දී මුහුණ දුන් දුෂ්කරතා සහ

අනාගතයේදී එවැනි තත්වයක් වළක්වා ගැනීමට අවශ්‍ය පහසුකම් මොනවාද යන්න ඉස්මතු කරනු ඇත.

ඩිප්ලෝමා පාඨමාලාවට ඇතුළත් වන සිසුන් රටේ විවිධ අංශවලින් සහ ස්ථානයෙන් පැමිණේ. අධ්‍යයනවලින් පෙනී යන්නේ බඳවා ගත් සිසුන්ගෙන් වැඩි ප්‍රමාණයක් වඩා අඩු වරප්‍රසාද ඇති අය වන බවයි. තවද, සිසුන් නිතරම සන්නිවේදන මාර්ග පිලිබඳ ගැටලුවකට මුහුණ දුන්හ. එබැවින්, මාර්ගගත දේශන භාරදීම කාර්ය මණ්ඩලයට අභියෝගාත්මක කාර්යයක් විය. එපමණක් නොව, කෙටි කාලයක් සඳහා සමහර මොඩියුල සඳහා දේශන පැවැත්වීම අත්හිටුවීමට යොමු කරන ලද පටිගත කිරීමේ පහසුකම නොමැති වීම. එසේ වුවද එම වසන්ගත තත්වය හමුවේ වුව ද කථිකාචාර්යවරු දේශන පැවැත්වීමට සහ සිසුන්ට ඔවුන්ගේ ඉගෙනීම සඳහා සහාය වීමට උපරිම උත්සාහයක් ගත්හ.

අනපේක්ෂිත තත්වය හමුවේ ආධාර අවශ්‍ය වූ සිසුන් (මූල්‍යමය වශයෙන් හෝ වෙනත් ආකාරයකින්) හඳුනා ගැනීම සඳහා සියලු අංශ විසින් සමීක්ෂණ සිදු කරන ලද අතර, මාර්ගගත ඉගෙනුම් ක්‍රියාකාරකම්වල යෙදී සිටියදී ඔවුන්ට තිබූ බාධක අපට මාර්ගගත ඉගෙනුම් ක්‍රියාවලියේදී සිසුන් මුහුණ දුන් විවිධ ගැටළු හඳුනා ගැනීමට හැකි විය. නිදසුනක් ලෙස, දුර්වල සංනිවේදනය, දත්ත කාඩ්පත් මිලදී ගැනීමට ඇති නොහැකියාව, ඔවුන්ගේ ප්‍රදේශයේ දත්ත කාඩ්පත් සැපයීම සීමිත වීම, අන්තර්ජාලයට පිවිසීම සඳහා ස්මාර්ට්ෆෝන් නොතිබීම, පවුලේ ආදායම් තත්වයට බාධාවන් කිරීම හේතුවෙන් ඇතිවන මූල්‍ය දුෂ්කරතා ආදිය. සමහර ක්‍රියා කොවිඩ් -19 පැවති කාලය තුළ සිවිල් ඉංජිනේරු තාක්ෂණ අංශයේ සිසුන්ට ලබා දී ඇති පහසුකම් මෙහි දක්වා ඇත.

දෙවන වසරේ සිසුන් හතර දෙනෙකු (04) - ස්මාර්ට් ජංගම දුරකථන අවශ්‍ය වූ දෙදෙනෙකු (02) සහ දෛනික ජීවන රටාවට හානි නොවන පරිදි දත්ත කාඩ් පත් මිලදී ගැනීමට මූල්‍ය ආධාර අවශ්‍ය දෙදෙනෙක් (02) සිටියහ.

- ස්මාර්ට් ජංගම දුරකථන දෙකක් මිලට ගෙන ඇත
  (අධ්‍යනාංශ මණ්ඩලය සහ නිසි බලධාරී වෙතින් ලබාගත් අරමුදල් වලින්.)
- සති දෙකකට වරක් මුදල් බැර කිරීම (මාර්ගගතව)
  (දත්ත සහ වෙනත් අවශ්‍යතා මිලදී ගැනීම සඳහා (දෙදෙනෙකුට) සිසුන් වෙත.)

ඒ හා සමානව, අනෙකුත් අංශවල කාර්ය මණ්ඩලය විසින් ද සිසුන්ට ද ආධාර ලබා දෙන ලදී.

ඒ අනුව, අන්තර්ජාල දේශන පැවැත්වීම සඳහා තාක්ෂණික ආයතනයට අංගසම්පූර්ණ පටිගත කිරීමේ පහසුකම් සහිත ස්ථානයක් අවශ්‍ය බව අපි හඳුනාගෙන ඇත්තෙමු. නුදුරු අනාගතයේ දී දුරස්ථ මාදිලියේ පාඨමාලා බෙදා හැරීමේදී අන්තර්ජාලය හරහා දේශන පැවැත්වීමට මෙම පහසුකම

වරප්‍රසාදයක් විය හැකිය. තවද, බොහෝ සිසුන් දේශනවලට සම්බන්ධ වූයේ ඔවුන්ගේ ස්මාර්ට් ජංගම දුරකථන මගිනි. කෙසේ වෙතත්, සිසුන්ට ලැප්ටොප් පරිගණකයක් මිලදී ගැනීම සඳහා ණය ක්‍රමයක් තිබේ නම් එය ප්‍රයෝජනවත් වන අතර කිසිදු දුෂ්කරතාවයකින් තොරව ඔවුන්ගේ අධ්‍යයන කටයුතු කරගෙන යාමට ඔවුන්ට උපකාරී වනු ඇති බව අපි හඳුනාගෙන ඇත්තෙමු.

කෙටි කාලීනව සිදු වූ මාර්ගගත දේශන (කෝවිඩ් -19 වසංගතය හේතුවෙන්) සිදු කිරීමේ ක්‍රමය විධිමත්ව ක්‍රියාත්මක කළහොත් ජාතික තාක්ෂණ ඩිප්ලෝමා පාඨමාලාව නහා සිටුවීමට මාර්ගගත දේශන උපකාරී වන බව අපට ඒත්තු ගියේය. මෙය නව යුගයක උදාව වනු ඇත.

මාර්ගගත දේශන හා T සහ L සමඟ, 2030 වසරට පෙර පවා ලැයිස්තුගත ඉලක්ක කිහිපයක් අපට ළඟා කර ගත හැකි යැයි අපි බලාපොරොත්තු වෙමු.

එවැනි;

- කර්මාන්තයේ අවශ්‍යතාවයට සරිලන සේ බඳවා ගැනීම ක්‍රමානුකූල ලෙස වැඩි කිරීම
- අවම නේවාසික පහසුකම් අවශ්‍යතා - මෙය අඩු අවදානම් / ආරක්ෂිත පරිසරයක් ප්‍රවර්ධනය කරන අතර සිසුන්ට උසස් තත්ත්වයේ පහසුකම් සැපයීම පහසු කරයි
- එක් සිසුවෙකු සඳහා බලශක්ති පරිභෝජනය අඩු කිරීම
- අපේක්ෂිත ඉලක්කය කරා ළඟා වීමට පවත්නා තත්වයේ ඇති ප්‍රධාන බාධකවලින් එකක් වන්නේ කාර්ය මණ්ඩලයේ හිඟයයි. අරමුදල් වෙන් කිරීම ප්‍රමාණවත් නොවීම නිසා බඳවා ගැනීමේ වේගය මන්දගාමී වේ. කෙසේ වෙතත්, මාර්ගගත ඉගෙනුම් පරිසරය අපට දේශන සාර්ථකව ඉදිරිපත් කිරීමට කදිම අවස්ථාවක් ලබා දුන්නේය.

### *2.3 කළමනාකරණ පද්ධතිවල ප්‍රමාණවත් බව*

ක්‍රියාකාරී සැලසුම් සැලසුම් කිරීම තුළින් ළඟා කර ගත හැකි වෙනත් ඉලක්ක කිහිපයක් කණ්ඩායම විසින් හඳුනාගෙන ඇත. නිදසුනක් ලෙස, ආරක්ෂිත, අවිහිංසාවාදී සහ ඵලදායී ඉගෙනුම් පරිසරයක් (ඉලක්කය 4. a) සැපයීම සහ දැරිය හැකි, විශ්වාසදායක, තිරසාර හා නවීන බලශක්ති සේවාවන් සඳහා ප්‍රවේශය (ඉලක්කය 7.1) (එක්සත් ජාතීන්ගේ 2019, 17 ඉලක්ක 2019). අවශ්‍ය තැන් සඳහා සීසීටීවී කැමරා සවි කිරීම තාක්ෂණික ආයතනයෙහි සිසුන්ට සහ සේවකයින්ට වඩා පහසු වටපිටාවක් ඇති කරයි. කෙසේ වෙතත්, පරිශ්‍රයේ පුනර්ජනනීය බලශක්තිය වැනි වෙනත් පහසුකම් සඳහා නම් ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර අරමුදල් වෙන් කළ යුතුය.

### 2.4 *පර්යේෂණ, නවෝත්පාදන සහ දැනුම මාරු කිරීම*

නව විෂයමාලා වෙනස්වීම් සමඟ සියලු විෂයයන් සඳහා ව්‍යාපෘති මොඩියුලයක් ඇතුළත් කර ඇත. ව්‍යාපෘති මොඩියුලයක් හඳුන්වාදීම මඟින් ව්‍යාපෘති / පර්යේෂණ කටයුතු සිදු කිරීමට හෝ මූලික මට්ටමින් නවෝත්පාදන අදහස් අත්හදා බැලීමට අවස්ථාව විවෘත වේ. ශිෂ්‍ය ව්‍යාපෘතියේ සොයාගැනීම් පුළුල් ප්‍රජාවකට, සම්මන්ත්‍රණ / සම්මන්ත්‍රණ හෝ ප්‍රදර්ශන මඟින් ගෙන යා හැකි අතර එමඟින් ජාතික සේවාවක් ඉටු කිරීමට තවදුරටත් හැකි වේ. කෙසේ වෙතත්, අත්හදා බැලීම්, ගුණාත්මක දත්ත එක්රැස් කිරීම සහ ප්‍රදර්ශන පැවැත්වීම සඳහා අවශ්‍ය ද්‍රව්‍ය මිලදී ගැනීමට ශිෂ්‍ය ව්‍යාපෘති සඳහා මුදල් වෙන් කිරීම අවශ්‍ය වේ.

## 3.0 *තිරසර සංවර්ධන අරමුණු ක්‍රියාත්මක කිරීම සඳහා අරමුදල්*

ලැයිස්තුගත ප්‍රධාන ප්‍රතිපත්ති හතර යටතේ දළ වශයෙන් අයවැය ඇස්තමේන්තු පහත වගුවේ සාරාංශ කරයි.

| ප්‍රතිපත්ති ක්ෂේත්‍රය | ඇස්තමේන්තුගත අයවැය (රුපියල්.) | සටහන් |
|---|---|---|
| 1. උසස් අධ්‍යාපනයට ප්‍රවේශය | • 3, 000, 000.00 | • අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලය බඳවා ගැනීම.<br>• පටිගත කිරීමේ කාමරය (ඔන්ලයින් ටී ඇන්ඩ් එල් සඳහා) |
| 2. උසස් අධ්‍යාපනයේ ගුණාත්මකභාවය හා අදාළත්වය | | |
| 3. කළමනාකරණ පද්ධතිවල ප්‍රමාණවත් බව | • 140, 000, 000.00 | • තිරසාර හා නවීන බලශක්ති සේවා සවි කිරීම (උදා: පුනර්ජනනීය බලශක්ති සංවර්ධන සැලසුම් ස්ථාපනය කිරීම සලකා බැලීම) සහ ආරක්ෂක සීසීටීවී කැමරා. |
| 4. පර්යේෂණ, නවෝත්පාදන සහ දැනුම ලබා දීම | • 1,500,000.00 | • සිසුන්ගේ පර්යේෂණ ව්‍යාපෘති සඳහා අරමුදල් සහ දැනුම පහසුකම් ලබා දීම. |

යොමුව:


1. සංගණන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව (ඩීසීඑස්), ශ්‍රී ලංකාව (2017), ශ්‍රී ලංකාවේ තිරසාර සංවර්ධන අරමුණු පිළිබඳ දර්ශක: 2017, ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය, ශ්‍රී ලංකාව,
URL: <http://www.statistics.gov.lk/sdg/application/publications/book.pdf>. [Viewed date: 19.02.2019].

2. 2. 17 ඉලක්ක (2019), තිරසාර සංවර්ධනය සඳහා 2030 න්‍යාය පත්‍රය, URL: <http://17goals.org/>. [Viewed date: 19.02.2019].

# 19. විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන

තාක්ෂණික ආයතනනය මොරටුව විශ්වවිද්‍යාලය

2020 දෙසැම්බර් 31 වන දිනට මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය

| වත්කම් | සටහන් | 2020 (රුපි) | 2020 (රුපි) | 2019 (රුපි) | 2019 (රුපි) |
|---|---|---|---|---|---|
| ජංගම වත්කම් | | | | | |
| බැංකුවේ ඇති මුදල් | 1 | 7,662,984 | | 15,417,625 | |
| ලැබිය යුතු දෑ | 2 | 17,829,860 | | 13,085,324 | |
| තොගය | | 5,574,104 | | 4,911,989 | |
| පෙර ගෙවීම් | 3 | 1,744,598 | | 457,358 | |
| අයෝජන (කෙටිකාලීන) | | 0 | **32,811,546** | 0 | **33,872,323** |
| | | | | | |
| ජංගම නොවන වත්කම් | | | | | |
| අයෝජන (දිගුකාලීන) | 4 | 16,201,310 | | 15,574,767 | |
| දේපල පිරියත හා උපකරණ | 5 | 8,295,013,253 | | 8,975,241,213 | |
| වෙනත් වත්කම් | 6 | 4,522,544 | | 2,772,631 | |
| | | | **8,315,737,107** | | **8,993,588,611** |
| මුළු වත්කම් | | | **8,348,548,653** | | **9,027,460,934** |
| | | | | | |
| බැරකම් | | | | | |
| ජංගම බැරකම් | | | | | |
| ගෙවිය යුතු දෑ | 7 | 15,374,451 | | 25,571,318 | |
| අත්හිටවූ අදායම් | 8 | 2,548,043 | | 4,710,315 | |
| උපචිත වියදම් | 9 | 22,242,805 | 40,165,299 | 31,515,638 | 61,797,316 |
| ජංගම නොවන බැරකම් | | | | | |
| පාරිතෝෂික ගෙවීම් සඳහා ප්‍රතිපාදන | | | 81,156,210 | | 72,678,983 |
| මුළු බැරකම් | | | **121,321,509** | | **(134,476,299)** |
| මුළු ශුද්ධ වත්කම් | | | **8,227,227,144** | | **8,892,984,635** |
| | | | | | |
| ශුද්ධ වත්කම් / හිමිකම් | | | | | |
| වැයවූ මූලධන ආධාර | 10 | 8,294,893,755 | | 8,966,181,866 | |
| වැයනොවූ මූලධන ආධාර | 11 | 9,857,047 | | 13,764,468 | |
| පොදු සංචිතය | 12 | (155,578,695) | | (154,441,090) | |
| පරිත්‍යාග | 13 | 4,093,286 | | 4,093,286 | |
| මූල්‍ය නොවන රාජ්‍ය දීමනා | 14 | 7,250 | | 7,250,000 | |
| ඒකරාශී වූ අරමුදල | 15 | 63,794,147 | | 46,028,569 | |
| ශේෂ අතිරික්තය | | 2,917,604 | | 10,107,536 | |
| | | | **8,227,227,144** | | **8,892,984,635** |
| මුළු ශුද්ධ වත්කම් / හිමිකම් | | | **8,227,227,144** | | **8,892,984,635** |

පිටු 34 සිට 41 දක්වා ඇති සටහන් මූල්‍ය ප්‍රකාශන වලට අයත් කොටසකි. මෙම මුදල් ප්‍රකාශන පිළියෙල කිරීමෙන් ඉදිරිපත් කිරීමක් කළමනාකරන මණ්ඩලයේ වගකීම් වේ. ආයතනයේ කළමනාකරන මණ්ඩලය වෙනුවෙන් අනුමත කොට අත්සන් තබන ලද්දේ:-

| | | | |
|---|---|---|---|
| අක/ මේජර් ජෙනරල් එස්.කේ. තිරුණාවුකරසු මයා<br>අධ්‍යක්ෂ | අක/ ආචාර්ය ඩී.පී. වන්ද්‍රසේකර මයා<br>සමාජික / කළමනාකරණ මණ්ඩලය | අක/එන්.ඩී.කුරුප්පුආරච්චි මයා<br>නියෝජ්‍ය ලේඛකාධිකාරී | අක/ එස්.පී.ඩී පිරිස් මිය<br>ජෙ.ස මූල්‍යාධිකාරී |

## තාක්ෂණික ආයතනනය මොරටුව විශ්වවිද්‍යාලය
## 2020 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වර්ෂය සඳහා මුල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

| මෙහෙයුම් අදායම් | සටහන | 2020 (රුපි) | 2019 (රුපි) |
|---|---|---|---|
| පුනරාවර්තන ආධාර | | 425,896,000 | 411,435,000 |
| රජයේ ආධාර - මහපොළ | | 8,290,000 | 8,506,000 |
| රජයේ ආධාර - ශිෂ්‍යාධාර | | 22,010,800 | 30,414,400 |
| වෙනත් අදායම් | 16 | 13,686,358 | 15,544,898 |
| ක්‍රමක්ෂය | | 681,848,033 | 681,438,698 |
| වෙනත් ආධාර | | 0 | 0 |
| පර්යේෂණ දිරිගැන්වීමේ ආධාර | | 176,182 | 72,180 |
| නායකත්ව සංවර්ධන දීමනාව | | | |
| ශිෂ්‍ය කේන්ද්‍ර අධ්‍යයන දීමනාව | | | |
| පැවරුම්, උපදේශන සහ කෙටි පාඨමාලා වලින් ලැබීම් | | 11,681,152 | 25,253,952 |
| | | **1,163,588,525** | **1,172,665,128** |
| මෙහෙයුම් වියදම් | | | |
| පෞද්ගලික වැටුප් හා චේතන | 17 | 329,498,875 | 334,971,926 |
| ගමන් වියදම් | 18 | 27,923 | 98,657 |
| සැපයුම් හා පරිභෝජන ද්‍රව්‍ය | 19 | 6,688,738 | 9,151,475 |
| නඩත්තු කිරීමේ වියදම් | 20 | 7,482,974 | 9,004,461 |
| ගිවිසුම් සේවා | 21 | 87,718,257 | 92,887,175 |
| පර්යේෂණ හා සංවර්ධන වියදම් | 22 | 633,365 | 734,537 |
| කාලය සහ ක්‍රමක්ෂය වියදම් | | 681,848,033 | 681,438,698 |
| වෙනත් මෙහෙයුම් වියදම් | 23 | 9,096,510 | 10,214,275 |
| මහපොළ | | 8,290,000 | 8,506,000 |
| ශිෂ්‍යාධාර | | 22,010,800 | 30,414,400 |
| පර්යේෂණ දිරිගැන්වීමේ වියදම් | | | 72,180 |
| හැකියාව වර්ධනය කිරීමේ වියදම් | | | 0 |
| නව ස්ථානගතකිරීම් සහ සංවර්ධනය ව්‍යාපෘති වියදම් | | | 0 |
| පැවරුම්, උපදේශන සහ කෙටි පාඨමාලා වලින් ලැබීම් | | 11,681,152 | 25,253,952 |
| මුළු මෙහෙයම් වියදම් | | **1,165,152,809** | **1,202,747,736** |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ඇතිවුනු අතිරික්තය / ඌනතාවය | | **(1,564,284)** | **(30,082,608)** |
| වත්කම් ඉවත් කිරීමේදී ලත් ලාභය | | **0** | **0** |
| | | **(1,564,284)** | **(30,082,608)** |

අක/ මේජර් ජෙනරල් එස්.කේ. තිරුණාවුකරසු මයා
අධ්‍යක්ෂ

අක/ ආචාර්ය ඩී.පී. චන්ද්‍රසේකර මයා
සමාජීක / කළමනාකරණ මණ්ඩලය

අක/එන්.ඩී.කුරුප්පුආරච්චි මයා
නියෝජ්‍ය ලේඛකාධිකාරී

අක/ එස්.පී.ඩී පිරිස් මිය
ජෙ.ස මුල්‍යාධිකාරී

## තාක්ෂණික ආයතනනය මොරටුව විශ්වවිද්‍යාලය
## 2020 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වර්ෂය සඳහා මුල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

| | සටහන | 10 | 11 | 12 | 13 | 14 | 15 | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 2018 දෙසැම්බර් 31 දිනට ශේෂය | | වැයවූ මූලධන ආධාර | වැයනොවූ මූලධන ආධාර | පොදු සංචිතය | පරිත්‍යාග | මුදල් නොවන රජයේ ආධාර | එක්රැස්වූ අරමුදල | ශේෂ අතිරික්තය | මුළු මුදල |
| | | 9,625,105,118 | 14,798,158 | (126,726,352) | 4,093,286 | 7,250,000 | 27,305,985 | 10,845,828 | 9,570,131,616 |
| මූල්‍ය ප්‍රගති ප්‍රකාශන වල සඳහන් නොවූ ශුද්ධ ලාභ සහ පාඩු | | | | 2,367,870 | | | | (8,197,885) | (5,830,015) |
| මාරු කිරීම් / ශුද්ධ වලනයන් | | 22,515,446 | (1,033,690) | | | | 18,722,584 | | 40,204,340 |
| කාල සීමාව තුල අතිරික්තය / ඌනතාවය | | | | (30,082,608) | | | | | (30,082,608) |
| ක්‍රමක්ෂය | | (681,438,698) | | | | | | | (681,438,698) |
| 2019.12.31දිනට ශේෂය | | 8,966,181,866 | 13,764,468 | (154,441,090) | 4,093,286 | 7,250,000 | 46,028,569 | 10,107,536 | 8,892,984,635 |
| දේපල ප්‍රත්‍යාගනනයෙන් පසු අතිරික්තය / ඌනතාවය | | | | | | | | | |
| මාරුකිරීම් ශුද්ධ වලනයන් | | 10,559,922 | (3,907,221) | | | | 17,765,578 | | 24,481,279 |
| මූල්‍ය ප්‍රගති ප්‍රකාශනයන්හි සඳහන් නොවූ ශුද්ධ ලාභ සහ පාඩු | | | | 426,679 | | | | (7,189,932) | |
| ක්‍රමක්ෂය | | (681,848,033) | | | | | | | (681,848,033) |
| අදාල කාලය සඳහා අතිරික්තය / ඌනතාවය | | | | (1,564,284) | | | | | (1,564,284) |
| 2020 දෙසැම්බර් 31 දිනට ශේෂය | | 8,294,893,755 | 9,857,047 | 155,578,695 | 4,093,286 | 7,250,000 | 63,794,147 | 2,917,604 | 8,227,227,144 |

අක/ මේජර් ජෙනරල් එස්.කේ. තිරුණාවුකරසු මයා
අධ්‍යක්ෂ

අක/ ආචාර්ය ඩී.පී. වන්ද්‍රසේකර මයා
සමාජීක / කළමනාකරණ මණ්ඩලය

අක/එන්.ඩී.කුරුප්පුආරච්චි මයා
නියෝජ්‍ය ලේඛකාධිකාරී

අක/ එස්.පී.ඩී පිරිස් මිය
පෙ.ස මුල්‍යාධිකාරී

තාක්ෂණික ආයතනනය මොරටුව විශ්වවිද්‍යාලය
**2020 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ සටහන**

| මෙහෙයුම් ක්‍රියාකාරිත්වයන් තුල මුදල් ප්‍රවාහයන් | සටහන් | 2020 | | 2019 | |
|---|---|---|---|---|---|
| | | රුපි | රුපි | රුපි | රුපි |
| අතිරික්තය / ඌනතාවය සාමාන්‍ය ක්‍රියාකාරිත්වය තුලින් | | (1,564,284) | | (30,082,608) | |
| මුදල් නොවන සංචලනය | | | | | |
| ක්ෂය වීම් | | 681,848,033 | | 681,438,698 | |
| ක්‍රමක්ෂය | | (681,848,033) | | (681,438,698) | |
| අතිරික්තය / (ඌනතාවය) පාරිතෝෂික වෙන්කිරීම් | | 8,477,227 | | 37,592,799 | |
| වෙනත් ගැලපීම් | 25 | 426,683 | | 702,790 | |
| වත්කම් ඉවත්කිරීමේදී ලත් ලාභය | | | | 0 | |
| අතිරික්තය / (ඌනතාවය) කාරක ප්‍රාග්ධනය | | | | | |
| (ඌනතාවය / අතිරික්තය) ලැබීම් | 26 | (6,693,891) | | (2,423,315) | |
| අතිරික්තය / (ඌනතාවය) අත්හිටවූ ආදායම | | (2,162,272) | | (3,106,654) | |
| අතිරික්තය / (ඌනතාවය) ගෙවීම් | 27 | (10,196,867) | | 3,480,185 | |
| (ඌනතාවය) / අතිරික්තය උපචිත වියදම් | | (9,272,878) | | (15,686,513) | |
| මෙහෙයුම් ක්‍රියාවන් තුලින් ශුද්ධ මුදල් ප්‍රවාහය | | | (20,986,282) | | (9,523,316) |
| ආයෝජන මුදල් ප්‍රවාහය | | | | | |
| යාන්ත්‍රෝපකරන සහ උපකරණ මිලදී ගැනීම් (උපලේඛන ඩී සහ ඊ) | | (5,231,039) | | (2,363,843) | |
| ඉඩම් සඳහා ගෙවීම් (ප්‍රාග්ධන) | | | | | |
| වෙනත් ව්‍යාපෘති සඳහා ගෙවීම් | | (176,182) | | (72,180) | |
| වත්කම් විකිනීම් | | | | 0 | |
| ආයෝජන වැඩිකිරීම | | (626,543) | | | |
| ආයෝජන ක්‍රියා තුලින් ශුද්ධ මුදල් ප්‍රවාහය | | | (6,033,764) | | (2,436,023) |
| මූල්‍යමය ක්‍රියාකාරකම් තුල මුදල් ප්‍රවාහය | | | | | |
| මූලධන ආධාර | 11 | 1,500,000 | | 2,996,000 | |
| අතිරික්තය / ඌනතාවය විශේෂිත අරමුදල් | | 17,765,578 | | 18,722,584 | |
| අතිරික්තය / ඌනතාවය ආධාර | | | | 0 | |
| මූල්‍ය කටයුතු තුලින් ශුද්ධ මුදල් ප්‍රවාහය | | | 19,265,578 | | 21,718,584 |
| ශුද්ධ අතිරික්තය / (ඌනතාවය) මුදල් සහ මුදල් සමතාව | | | (7,754,468) | | (9,759,245) |
| අදාල කාලය ආරම්භයේ මුදල් සහ මුදල් සමතාව | | | 15,417,452 | | 5,658,407 |
| අදාල කාලය අවසානයේ මුදල් සහ මුදල් සමතාව | 28 | | 7,662,984 | | 15,417,652 |

අක/ මේජර් ජෙනරල් එස්.කේ. තිරුණාවුකරසු මයා
අධ්‍යක්ෂ


අක/ ආචාර්ය ඩී.පී. චන්ද්‍රසේකර මයා
සමාජික / කළමනාකරණ මණ්ඩලය

අක/එන්.ඩී.කුරුප්පුආරච්චි මයා
නියෝජ්‍ය ලේඛකාධිකාරී

අක/ එස්.පී.ඩී පිරිස් මිය
ජෙ.ස මූල්‍යාධිකාරී

- **(මූල්‍ය ප්‍රකාශනයට අදාල සියලු විස්තරාත්මක සටහන් ඉංග්‍රීසි පිටපතෙහි දක්වා ඇත)**

# 20. විගණකාධිපතිවරයාගේ වාර්තාව



ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. HED/C/ITUM/6/20/FA ඔබේ අංකය உமது இல. Your No.

දිනය திகதி Date 2021 ජූනි 23 දින

Institute of Technology Director's Office 30 JUN 2021 University of Moratuwa

SAB
for Study Visit & Spr

අධ්‍යක්ෂ

තාක්ෂණික ආයතනය - මොරටුව විශ්වවිද්‍යාලය

**මොරටුව විශ්වවිද්‍යාලීය තාක්ෂණික ආයතනයේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව**

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

මොරටුව විශ්වවිද්‍යාලීය තාක්ෂණික ආයතනයේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශන, එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් සහ සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, ආයතනයේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

Institute of Technology Finance 05 JUL 2021 Division University of Moratuwa

No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

සමාලෝචිත වර්ෂය තුළදී මුදලින් ගෙවන ලද රු. 2,417,975 ක් වූ පාරිතෝෂික වියදම් පාරිතෝෂික වෙන් කිරීමේ ගිණුමට හර කිරීම වෙනුවට පාරිතෝෂික වියදම් ගිණුමට හර කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයට අදාල පාරිතෝෂික වියදම හා පාරිතෝෂික වෙන් කිරීමේ ගිණුම එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි. ඒ අනුව වර්ෂයේ ඌනතාවය එම වටිනාකමින් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 ආයතනයේ 2020 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු**

මෙම විගණන වාර්තාවේ දිනට පසුව මට ලබා දීමට බලාපොරොත්තු වන ආයතනයේ 2020 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ .මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමග හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

ආයතනයේ 2020 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මම නිගමනය කළහොත්, නිවැරදි කිරීම සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම කරුණු සන්නිවේදනය කළ යුතුය. තව දුරටත් නිවැරදි නොකළ වරදවා දැක්වීම් තිබේ නම්, ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

**1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ආයතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය ආයතනය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආයතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ආයතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, ආයතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

**1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම**

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම් මත රඳා පවතී .

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම

හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මහහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබෙද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම් යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

**2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

2.1.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා ආයතනය පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමග අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුළ පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවිය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට ආයතනය සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණය හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

| නීතිරීති / විධානයට යොමුව | නිරීක්ෂණය |
|---|---|
| 2003 ජූනි 02 දිනැති අංක පී‍ඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | සමාලෝචිත වර්ෂයට අදාල සංයුක්ත සැලැස්මක් හා ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. |

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ බලතල , කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව .

**2.3 වෙනත් කරුණු**

(අ) 2020 දෙසැම්බර් 31 දිනට කාල පරතරය වර්ෂ 01 සිට වර්ෂ 02 අතර එකතු වටිනාකම රු.8,699,389 ක් සහ වර්ෂ 02 ට වැඩි එකතු වටිනාකම රු.460,655 ක් වූ ණයගිමි ශේෂ නිරවුල් කර නොතිබුණි.

(ආ) 2017 වර්ෂයේ මාර්තු සිට 2020 දෙසැම්බර් දක්වා කාලය තුළ විදුලි ගාස්තු නියමිත දිනයට නොගෙවීම නිසා එම කාලය තුළදී ප්‍රමාද ගාස්තු ලෙස එකතුව රු.1,675,585 ක් ගෙවා නිබුණි.

ඩබ්ලිව්.ජී.සී.වික්‍රමරත්න
විගණකාධිපති

# 21. විගණකාධිපතිවරයාගේ වාර්තාවට පිලිතුරු

**මොරටුව විශ්වවිද්‍යාලයීය තාක්ෂණික ආයතනයේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික සහ නියාමන අවශ්‍යතා පිලිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව.**

| විගණන මතය | පැහැදිලි කිරීම් / ගෙන ඇති ක්‍රියාමාර්ග |
|---|---|
| **1.1** තත්වාගණනය කළ මතය | **1.1** තත්වාගණනය කළ මතය |
| **1.2** තත්වාගණනය කළ මතය සඳහා පදනම | **1.2** තත්වාගණනය කළ මතය සඳහා පදනම |
| සමාලෝචිත වර්ෂය තුල දී මුදලින් ගෙවන ලද රු. **2,417,975**ක් වූ පාරිතෝෂික වියදම් පාරිතෝෂික වෙන් කිරීම් ගිණුමට හර කිරීම වෙනුවට පාරිතෝෂික වියදම් ගිණුමට හර කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයට අදාල පාරිතෝෂික වියදම් හා පාරිතෝෂික වෙන් කිරීමේ ගිණුම එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.<br>ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තව දුරටත් විස්තර කර ඇත. මාගේ තත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. | සමාලෝචිත වරෂය තුලදී ගෙවන ලදි පාරිතෝෂික දීමනා රු. 2,417,975 /= ක මුදල සඳහා අදාල ගැලපුම් කිරීමට සටහන් තබා ගන්නා ලදි. |

| විගණන මතය | පැහැදිලි කිරීම් / ගෙන ඇති ක්‍රියාමාර්ග |
|---|---|
| **1.1** තත්වාගණනය කළ මතය | **1.1** තත්වාගණනය කළ මතය |
| **1.2** තත්වාගණනය කළ මතය සඳහා පදනම | **1.2** තත්වාගණනය කළ මතය සඳහා පදනම |
| වෙනත් කරුණු<br><br>අ. **2020** දෙසැම්බර් **31** දිනට කාල පරතරය වර්ෂ **01** සිට **02** අතර එකතු වටිනාකම රු. **8,699,389** ක් සහ වර්ෂ **2** ට වැඩි එකතු වටිනාකම රු. **460,655** ක් වූ ණයහිමි ශේෂ නිරවුල් කර නොතිබුණි.<br><br>ආ. **2017** වර්ෂයේ මාර්තු මස සිට **2020** දෙසැම්බර් දක්වා කාලය තුල දී ප්‍රමාද ගාස්තු ලෙස එකතුව රු. **1,675,585** ක් ගෙවා තිබුණි. | වෙනත් කරුණු<br><br>ඔබ විසින් පෙන්වා ඇති ණයහිමි ශේෂ අදාල පාර්ශවයන් විසින් ඉල්ලුම් ලිපි ලබාගෙන නිරවුල් කිරීමට සටහන් තබාගන්නා ලදි.<br><br>මොරටුව විශ්වවිද්‍යාලයීය තාක්ෂණික ආයතන පරිශ්‍රයෙන් දියගම පරිශ්‍රය වෙත ප්‍රතිස්ථාපනය කිරීමෙන් පසු 2017 වසරේ සිට 2019 වසර දක්වා වැඩිවූ වියදම් හේතුවෙන් අතිරේක ප්‍රතිපාදන ලබා දෙන ලෙස මහා භාණ්ඩාගාරයෙන් අදාල වවුචර් පත්ද ඉදිරිපත් කරමින් කිහිපවරක් ඉල්ලීම් කරන ලද නමුත් කිසිදු අතිරේක ප්‍රතිපාදනයක් නොලැබුණි. එම හේතුව නිසා විදුලි බිල්පත් මෙන්ම අනෙකුත් ගෙවීම්ද නිසි වේලාවට සිදු කර ගත නොහැකි විය.<br><br>කෙසේවුවද මේ වනවිට එම තත්ත්වය වලක්වා ගැනීමට කටයුතු කරන ලද අතර දැනට විදුලි බිල්පත් සඳහා ප්‍රමාද පොලී ගෙවීමක් සිදු නොකරන බවත්, නිසි වේලාවට බිල්පත් පියවීම සිදු කරන බවත් දන්වා සිටිමි.<br><br>තත්වය මෙසේ වුවත් පුනරාවර්තන වියදම් වෙනුවෙන් ලැබෙන ප්‍රතිපාදන ඉතා අවම මට්ටමේ පවතින බැවින් හා නිසි කලට නොලැබෙන බැවින් ඉදිරියේදී මෙම තත්වය වෙනස් විය හැක |

අධ්‍යක්ෂ
තාක්ෂණික ආයතනය
මොරටුව විශ්වවිද්‍යාලය